
# පාඨමාලා ආශ්‍රිත ක්‍රියාමූලික පර්යේෂණ සඳහා යොමු කිරීමක්



පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

2015

# පාඨමාලා ආශ්‍රිත ක්‍රියාමූලික පර්යේෂණ සඳහා යොමු කිරීමක්




පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

2015

Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

| | |
|---|---|
| උපදේශනය | මහාචාර්ය ගුණපාල නානායක්කාර<br>අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය |
| | බී. සනත් පූජිත<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>සැලසුම් පර්යේෂණ හා සංවර්ධන පීඨය |
| අධීක්ෂණය හා නියාමනය | එම්. එන්. එස්. එදිරිසිංහ<br>අධ්‍යක්ෂ<br>පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව |
| සම්පත් දායකත්වය (බාහිර) | ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු<br>විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන පීඨය |
| | මහාචාර්ය ඩබ්. එම්. පී. ඒ. සේතුංග<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය |
| (අභ්‍යන්තර) | ආර්. එම්. සමන් කුමාරි රණසිංහ<br>අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| | එම්. එන්. එස්. එදිරිසිංහ<br>අධ්‍යක්ෂ, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව |
| | ඩබ්. කේ. ශිරානි පුෂ්පමාලා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව |
| | යූ. ජී. ඩබ්. ඩබ්. ගමගේ<br>සහකාර කථිකාචාර්ය, ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව |
| | ඒ. කේ. පනාගොඩ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| | ජී. එච්. අසෝකා<br>ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ, සම්භාව්‍ය භාෂා, විදේශ භාෂා සහ ද්වී භාෂා<br>අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| අත්පොත සැකසුම හා<br>සම්බන්ධීකරණය | ඩබ්. කේ. ශිරානි පුෂ්පමාලා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව |
| සංස්කරණය | ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු<br>විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන පීඨය |
| අක්ෂර සංයෝජනය | නිල්මිණි ප්‍රනාන්දු (පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව) |
| කංචුකය නිර්මාණය | චතුර මධුසංඛ (විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව) |
| විවිධ සහාය | නිසංසලා ජයරාණි (පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව) |

Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

# පටුන

**පිටු අංකය**


| | |
|---|---|
| හැඳින්වීම | 1 |
| ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවර්ධනයෙහි ලා ජාතික අධ්‍යාපන ආයතනය | 2 |
| ක්‍රියාමූලික පර්යේෂණවල ස්වභාවය | 3 |
| ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු අධ්‍යාපන පාඨමාලා ආශ්‍රිත ක්‍රියාමූලික පර්යේෂණ අරමුණු | 3 |
| ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ නිර්වචන | 3 |
| ක්‍රියාමූලික පර්යේෂණ වෙනත් පර්යේෂණවලින් වෙනස් වන ආකාරය | 4 |
| ප්‍රත්‍යාවේක්ෂණය | 8 |
| ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාදාමය | 10 |
| ක්‍රියාමූලික පර්යේෂණ යෝජනාව | 11 |
| ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාව ලිවීම සඳහා පොදු උපදෙස් | 12 |
| ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාවේ ව්‍යූහය | 12 |
| ක්‍රියාමූලික පර්යේෂණ අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා තාක්ෂණික උපදෙස් | 15 |
| ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාව ඇගැයීම් පටිපාටිය | 17 |
| ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාව ඇගැයීම් නිර්ණායක | 19 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 28 |
| ඇමුණුම් | 30 |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

# හැඳින්වීම

ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ විවිධ ආකෘති ඇතත් එහි මූලික අරමුණ වන්නේ තම වෘත්තීය භූමිකාවේ දී මුහුණ දෙන ගැටලු පර්යේෂණාත්මක ප්‍රවේශයකින් විසඳා ගැනීම සහ එමගින් වෘත්තීය සංවර්ධනය කර ගැනීම ය. ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ පාඨමාලා ආශ්‍රිත ව ක්‍රියාත්මක වන ක්‍රියාමූලික පර්යේෂණ ද පාඨමාලාවල විවිධතා අනුව, පොදු ලක්ෂණ සහිත ව මෙන් ම එකිනෙකට  වෙනස් වූ හැඩහුරුකම් සහිත ව ද ක්‍රියාත්මක වේ.

මෙම විවිධත්වය හමුවේ පාඨමාලා ආශ්‍රිතව ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාත්මක කිරීම හා ඇගැයීම් ක්‍රියාවලියේ සංගත බව පිළිබඳ ගැටලු මතු විය. ඊට පිළියම් ලෙස ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවට 2006 දී "ක්‍රියාමූලික පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ ප්‍රගති සමාලෝචනය" සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දෙන ලදි. ඒ අනුව වසර කීපයක් පාඨමාලා ආශ්‍රිත ව ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාත්මක විය. ජාතික අධ්‍යාපන ආයතනය මගින් ක්‍රියාත්මක කරන පාඨමාලා ආශ්‍රිත ව ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාත්මක කිරීමට අදාළ ව පොදු උපදෙස් මාලාවක් හා ඇගයීම් පටිපාටියක අවශ්‍යතාව නැවත සලකා බලා 2011 වර්ෂයේ දී නැවත වරක් ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සහ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව ආශ්‍රිත ක්‍රියාමූලික පර්යේෂණ සඳහා මග පෙන්වීම පිණිස ආකෘතියක් සහිත අත්පොත් දෙකක් හඳුන්වා දෙන ලදි. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන්ගේ ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් 2012 දී සම්පාදනය කරන ලදි.

ක්‍රියාමූලික පර්යේෂණ මූලිකාංග ඇතුළත් විය යුතු වුවත් සෑම ක්‍රියාමූලික පර්යේෂණයක් ම ඊට ම සුවිශේෂ ලක්ෂණවලින් ද යුක්ත ය. මේ අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කෙරෙන ගුරු අධ්‍යාපන පාඨමාලා ආශ්‍රිත ව ක්‍රියාත්මක වන ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලියේ දී මූලිකාංග රැක ගන්නා අතර ම පර්යේෂණ වාර්තාවල සංගත බවක්  පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.  ඊට ප්‍රතිචාර ලෙස පූර්ව ආකෘති සම්පාදනය සඳහා දායක වූ විද්වත් මණ්ඩලය සහ බාහිර වෙනත් පාර්ශ්ව සමඟ පැවති කතිකාවතකට අනුව, ආයතනය මගින් ඉදිරියේ දී පාඨමාලා අවශ්‍යතාවක් ලෙස ක්‍රියාත්මක කරන ක්‍රියාමූලික පර්යේෂණ සඳහා මූලික මගපෙන්වීමක් සහිත මෙම ග්‍රන්ථය සම්පාදනය කරන ලදි.

ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලිය අනෙකුත් පර්යේෂණවලින් වෙනස් වන ආකාරය, ක්‍රියාමූලික පර්යේෂණ යෝජනාව, ක්‍රියාමූලික පර්යේෂණය අවසානයේ ගුරු සිසුන් ඉදිරිපත් කරන වාර්තාවේ ව්‍යුහය සහ වාර්තාව ඉදිරිපත් කිරීමට අදාළ තාක්ෂණික උපදෙස් ද ග්‍රන්ථයෙහි අන්තර්ගත ව ඇත. ක්‍රියාමූලික පර්යේෂණයේ මූලික ව ම සහ පළමු ව වෙනස් වන්නේත් සංවර්ධනය වන්නේත්  පර්යේෂණයේ නියැළෙන වෘත්තිකයා වන බැවින් ඇගයීම් පටිපාටිය සැකසීමේ දී වෘත්තීය සංවර්ධනය ඇගැයීමට වැඩි බරක් තබමින් ලකුණු දීමේ පටිපාටිය ද සකස් කරන ලදි. ඒ අනුව ඇගයීම් නිර්ණායක සකස් කරන ලදි. මෙම ග්‍රන්ථය


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

ආයතනයේ විවිධ පාඨමාලා ආශ්‍රිත ව සහ විද්‍යාපීඨ ආශ්‍රිත ගුරු සිසුන් සඳහා ක්‍රියාත්මක වන ක්‍රියාමූලික පර්යේෂණ සඳහා මූලික මග පෙන්වීමක් පමණක් වන අතර, පාඨමාලා අවශ්‍යතාව සලකා බලා මෙම ආකෘතිය අවශ්‍ය පරිදි විකරණය කර ගත හැකි ය. එහෙත් එහි මූලික හැඩය පාඨමාලා ආශ්‍රිත ව ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

## ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවර්ධනයෙහි ලා ජාතික අධ්‍යාපන ආයතනය

අධ්‍යාපන ව්‍යවහාර දියුණු කිරීම අරමුණු කර ගනිමින් 1967 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ ක්‍රියාමූලික පර්යේෂණ නියාමක ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ ක්‍රියාමූලික පර්යේෂණ ඉතිහාසය හා සම්බන්ධ ප්‍රථම ලිඛිත සාක්ෂ්‍යය වේ. අධ්‍යාපනය හා සම්බන්ධ විවිධ පාර්ශ්වයන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා ජාතික අධ්‍යාපන ආයතනය 1989 වර්ෂයේ සිට ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවර්ධනයෙහි නිරත වේ. එහි ආරම්භක පියවර එකල පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය ජී. බී. ගුණවර්ධන විසින් ඇරඹි "ව්‍යවහාරිකයන් සඳහා වූ පර්යේෂණ" මැයෙන් වූ ව්‍යාපෘතියයි.

පියවර හතරකින් ගුරුවරුන් 23 දෙනෙකු සමග 1989-1995 කාලයේ ක්‍රියාත්මක කළ එම ව්‍යාපෘතියේ දී ගුරුවරුන් දිනපොත් භාවිත කරමින් පන්ති කාමරයේ ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත රැස් කරන ලදි. එම දත්ත පදනම් ව පර්යේෂණ ඒකකයේ පර්යේෂණ සමායෝජකයන් විසින් පර්යේෂණ වාර්තාව ලියන ලදි. පසුව 1996 දී ගුරුවරුන් සම්පූර්ණ පර්යේෂණ වාර්තාව ම ලියන ආකාරයට "ගුරුවරයා පර්යේෂක වශයෙන්" යන නමින් ව්‍යාපෘතිය විකරණය කරන ලදි. එම ව්‍යාපෘතියට අදාළ ව 1996-1998 කාලයේ ගුරුවරුන් 13 දෙනෙක් කළ පර්යේෂණ වේ. ඉන් පසුව ගුරුවරුන්, ගුරු උපදේශකවරුන් 50ක් සමග 2007 දී ක්‍රියාත්මක කළ ක්‍රියාමූලික පර්යේෂණ මාලාව, ක්‍රියාමූලික පර්යේෂණ දේශීය හා විදේශීය ලෙස ප්‍රචලිත කිරීමට ඉවහල් විය.

මීට අමතර ව ජාතික අධ්‍යාපන ආයතනයේ විවිධ දෙපාර්තමේන්තු ක්‍රියාමූලික පර්යේෂණ ප්‍රවර්ධනය උදෙසා යොමු ව තිබේ. අධ්‍යාපන කළමනාකරණ සංවර්ධන දෙපාර්තමේන්තුව, පශ්චාත් උපාධි කළමනාකරණ උපාධි පාඨමාලාවේ පර්යේෂණ විෂයයට ක්‍රියාමූලික පර්යේෂණ විෂය කොටස් ඇතුළත් කරන ලදි. අනතුරු ව විශේෂයෙන් 2000න් පසු ජාතික අධ්‍යාපන ආයතනය ක්‍රියාත්මක කරන ගුරු අධ්‍යාපන පාඨමාලාවල අංගයක් ලෙස ක්‍රියාමූලික පර්යේෂණ එක් කරන ලදි. ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය වැඩි දියුණුව අරමුණු කර ගනිමින් අධ්‍යාපන පාඨමාලා සඳහා හඳුන්වා දුන් ක්‍රියාමූලික පර්යේෂණ, වර්තමානයේ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන අධ්‍යාපනවේදී උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලා සඳහා අනිවාර්ය අංගයකි. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල ඩිප්ලෝමා පාඨමාලාවේ ද ක්‍රියාමූලික පර්යේෂණ අනිවාර්ය අංගයක් වේ. ඊට අමතර ව ජාතික අධ්‍යාපන ආයතනයේ විශේෂ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව, සම්භාව්‍ය භාෂා, විදේශ භාෂා සහ ද්වි භාෂා ඒකකය සහ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරෙන පාඨමාලා සහ ගුරු ශක්‍යතා සංවර්ධන වැඩසටහන් ආශ්‍රිත ව ද ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාත්මක කෙරේ.


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

## ක්‍රියාමූලික පර්යේෂණවල ස්වභාවය

ක්‍රමානුකූල හා විද්‍යාත්මක ප්‍රවේශයක් අනුගමනය කරමින් ආනුභවික ව සත්‍ය සොයා යෑම පර්යේෂණවල දී සිදුවේ. එහි මූලික අරමුණ වන්නේ නව දැනුම උත්පාදනය හෝ පවත්නා දැනුම සත්‍ය දැයි තහවුරු කර ගැනීම ය. එනම් පර්යේෂණයක් යනු දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා යම් යම් ක්ෂේත්‍ර (උදාඃ අධ්‍යාපනය, සමාජ විද්‍යාව) ඔස්සේ විධිමත් ලෙස නව දැනුම ගවේෂණය කිරීමකි. ඒ සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන ප්‍රවේශ (Approaches) හා සමීක්ෂණ, සම්පරීක්ෂණ, ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය (case study) වැනි ක්‍රම (Methods) භාවිත වේ.

අනෙකුත් පර්යේෂණවලට සාපේක්ෂ ව ක්‍රියාමූලික පර්යේෂණවල දී පර්යේෂකයා විසින් ම තමාට මතු වූ ගැටලුවක් ප්‍රායෝගික ව විසඳා ගැනීමට ක්‍රියාත්මක වීම සුවිශේෂ ලක්ෂණයකි. එය ක්‍රියාමූලික පර්යේෂණ අනෙකුත් පර්යේෂණ ප්‍රවේශවලින් වෙනස් වන ප්‍රධාන ම ලක්ෂණය වේ. මේ මූලික වෙනස නිසා ම ක්‍රියාමූලික පර්යේෂණවලට සුවිශේෂ වූ සංකල්ප, න්‍යාය හා මූලධර්ම අන්තර්ගත ය. ඒ අනුව ක්‍රියාමූලික පර්යේෂණ කරන වෘත්තිකයන්ට සුවිශේෂී වන පර්යේෂණ රටාවක් ද තිබිය යුතු ය.

## ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු අධ්‍යයන පාඨමාලා ආශ්‍රිත ක්‍රියාමූලික පර්යේෂණ අරමුණු

1. වෘත්තියක් කිරීමේ දී අත්දකින ගැටලු ගැඹුරට අධ්‍යයනයෙන් ලබන අඛණ්ඩ ඉගෙනුමෙන් ස්වකීය වෘත්තීය නිපුණතා සංවර්ධනය කර ගැනීම
2. වෘත්තිකයාට සම්බන්ධ ක්‍රියා පිළිබඳ ලබන ගැඹුරු අවබෝධයෙන්, ව්‍යවහාරය පදනම් කර ගත් න්‍යාය ගොඩ නගා ගැනීම නිසා වෘත්තිය හා එයට සම්බන්ධ පාර්ශවකරුවන් සංවර්ධනය
3. ක්‍රියාමූලික පර්යේෂණයෙන් ලබන පන්නරයෙන් ක්ෂේත්‍රයේ ධනාත්මක වෙනසක් ඇති කිරීම

## ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ නිර්වචන

- ක්‍රියාමූලික පර්යේෂණයේ ස්වභාවය වන්නේ හුදෙක් ගැටලු නිරාකරණය පමණක් නොව ලෝකය අවබෝධ කර ගනිමින් වැඩි දියුණුවට පත් කිරීමට හා කරන ලද වෙනස්කම් ඇසුරෙන් ලැබූ ප්‍රතිඵල අනුව තවදුරටත් වැඩි දියුණු කළ යුත්තේ කෙසේදැයි සෙවීම ය (කෙමිස් හා මැක්ටර්ගාර්ට්ගේ, 1988).
- ක්‍රියාමූලික පර්යේෂණ දැනුම උත්පාදනයට නොව පරිචය වැඩිදියුණු කිරීමට ය. (එලියට්, 1991).
- ක්‍රියාමූලික පර්යේෂණයේ අරමුණ සාම්ප්‍රදායික පර්යේෂණයේ දී මෙන් නොව ව්‍යවහාරිකයන් සතු පීඩාකාරී හා සමීපගත දෛනික ගැටලු නිරාකරණය යි (මැක්කර්නන්, 1996).


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

- ක්‍රියාමූලික පර්යේෂණයේ සැබෑ අරමුණ වන්නේ පීඩාකාරී තත්ත්වය ඉවත් කිරීම හා ඵලදායී ක්‍රියාකාරිත්වය වෙනුවෙන් ඇති බාධක හා අවහිරතාවලින් නිදහස් කර ගැනීම ය. පර්යේෂණ ස්ථිතිය තුළ ජීවිතයේ ගුණාත්මක බව සංවර්ධනය කිරීම ය (මැක්කර්නන්, 1996).

දැනට පවතින තත්ත්වයේ වැඩි දියුණුවක් අපේක්ෂාවෙන් ක්‍රියාත්මක වන ක්‍රියාමූලික පර්යේෂණ, වෙනත් පර්යේෂණවලින් වෙනස් වන ආකාරය පිළිබඳ අවබෝධය වැදගත් ය.

## ක්‍රියාමූලික පර්යේෂණ වෙනත් පර්යේෂණවලින් වෙනස් වන ආකාරය

| වෙනත් වර්ගයේ පර්යේෂණ | ක්‍රියාමූලික පර්යේෂණ |
|---|---|
| • නව දැනුම සංවර්ධනයට දායක වේ | • වෘත්තීය පරිචය වැඩි දියුණු වේ. ඒ අනුව වෘත්තිකයා ලබන නව දැනුම ප්‍රචලිත කළ හැකි ය |
| • විස්තර කිරීම, පැහැදිලි කිරීම හා අර්ථ නිරූපණය | • විස්තර කිරීම, පැහැදිලි කිරීම, අර්ථ නිරූපණය සහ වෙනස් කිරීමට මැදිහත් වීම |
| • වාස්තවික ඉරියව්ව අවධාරණය කර ක්‍රමවත් විමසුම | • පුද්ගලානුබද්ධ අත්දැකීමෙන් දැනුම ලැබ කෙරෙන ක්‍රමවත් විමසුමකි. |
| • ක්‍රම විද්‍යාත්මක ප්‍රතිඡ්ඨා මත නාභිගත වේ. | • පර්යේෂකගේ වෘත්තීය අගයයන් අනුව නාභිගත වේ. |
| • අන්‍යයන් පර්යේෂණයට භාජනය කිරීම | • තමා ම තම ව්‍යවහාරයට එම ව්‍යවහාරයට සම්බන්ධ වූ අය පර්යේෂණයට භාජනය වේ. |
| • ක්‍රමවිද්‍යාව මූලික කර ගෙන පර්යේෂණය ක්‍රියාත්මක වේ. | • නම්‍ය හා අනුවර්තනීය ක්‍රියාවලියකින් පර්යේෂණය ක්‍රියාත්මක කෙරේ. |
| • බෙහෙවින් ම මහා පරිමාණයේ සිද්ධීන් පැහැදිලි කිරීම හා අනාවරණ විශාල සංගහනයකට සාධාරණීකරණය කරයි. | • තනි අවස්ථාවක් දැඩි ව විභාග කිරීම, එහි ප්‍රථිපලයක් ලෙස ප්‍රදීපනය හෙවත් පුද්ගලයාට නව ආලෝකයක් ලැබීම. |
| • රේඛීය ව ක්‍රියාත්මක වේ. | • චක්‍රීය ව ක්‍රියාත්මක වේ. |
| • විද්‍යාත්මක පදනම වේ. | • ප්‍රත්‍යවේක්ෂණය පදනම් වේ. |

මූලාශ්‍රය : ජාතික අධ්‍යාපන ආයතනය. (2003). *ක්‍රියාමූලික පර්යේෂණ වැඩ සටහන.* මහරගම: ප්‍රාථමික ගණිත ඒකකය.


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

# ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලිය


ක්‍රියාමූලික පර්යේෂණයක තිබිය යුතු මූලිකාංග තිබුණත් එය ක්‍රියාත්මක කිරීමේ ආකාර විවිධ ය. විවිධ පාර්ශව, විවිධ ස්ථානවලට හා ආයතනවලට සුවිශේෂී ව මතු වන, විවිධ වූ විවාදාපන්න ගැටලු සඳහා විසඳුම් සෙවීමේ අරමුණු සහිත ව එකිනෙකට වෙනස් දර්ශන - න්‍යාය - ක්‍රියාවලි - ප්‍රතිඵල - අපේක්ෂාවෙන් ක්‍රියාමූලික පර්යේෂණ දියත් කිරීම, මෙම විවිධත්වයට හේතුව වේ. ව්‍යවහාරය පදනම් කොට ගෙන ඇති වන ගැටලුවලට තෘණමූල මට්ටමේ සිට ම, එම මට්ටමට අනන්‍ය වූත්, ප්‍රායෝගික වූත් විසඳුම් සොයා ගැනීමට හැකි වීම ක්‍රියාමූලික පර්යේෂණවල සුවිශේෂත්වයක් මෙන් ම ශක්තියකි. ක්‍රියාමූලික පර්යේෂණ මගින්, අනෙකුත් පර්යේෂණ මගින් කෙරෙන පොදු දැනුම සොයා යාම වෙනුවට තෘණ මූල මට්ටමේ විවිධ පාර්ශවයන්ගේ දැනුම හා දෘෂ්ටිකෝණ පදනම් කරගෙන එම මට්ටමේ ඇති වන ගැටලු විසඳීමට, ප්‍රායෝගික විසඳුම් ලබාදීමට අවස්ථාව ලැබේ. වෘත්තිකයාට අදාළ යම් අවස්ථාවක්, පසුබිමක් වෙනස් කිරීම පමණක් නොව, එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගල වෘත්තීයමය තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට ද ක්‍රියාමූලික පර්යේෂණවලින් ලැබෙන පිටුබලය ඉමහත් ය.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාමූලික පර්යේෂණ ගත හොත් වෘත්තීය ක්‍රියාව, ක්‍රියාමූලික පර්යේෂණයේ ආරම්භය සහ එහි නිරතවීම සඳහා පදනම වේ. කිසියම් වෘත්තීය සංවර්ධනයක් අපේක්ෂා කරන්නකු ස්වකීය ව්‍යවහාරය පිළිබඳ විචාරාත්මක ප්‍රත්‍යවේක්ෂණයක නිරත වීම අත්‍යවශ්‍ය ය. ප්‍රත්‍යවේක්ෂණ මූලික කර ගනිමින් ගැටලුව විග්‍රහ කර ගැනීම, ගැටලුවට විසඳුම් අපේක්ෂාවෙන් සැලසුම් සැකසීම, සැලසුම් ක්‍රියාත්මක කිරීම, නියාමනය හා නැවත ප්‍රත්‍යවේක්ෂණ ඇසුරින් විසඳුම් සැලසුම් සංශෝධන කරමින් තවදුරටත් ක්‍රියාත්මක කිරීම යන චක්‍රීය ක්‍රියාවලිය ද, ක්‍රියාමූලික පර්යේෂණයක සුවිශේෂ ලක්ෂණයකි.

ක්‍රියාමූලික පර්යේෂණ යන පද 1946 දී මුලින් ම හඳුන්වා දී අදහස ඉදිරිපත් කළ කුර්ත් ලෙවින්ගේ (Kurt Levin) ක්‍රියාමූලික පර්යේෂණ ආකෘතිය (1වන රූපය ) **සැලසුම් කිරීම, කරුණු සොයා බැලීම, ක්‍රියාත්මක කිරීම** යන ප්‍රධාන අදියර තුනකින් සමන්විත චක්‍රීය ක්‍රියාදාමයකි. ලෙවින්ට අනුව සැලසුම්කරණය ආරම්භ වන්නේ සාමාන්‍ය අදහසක් ඇසුරිනි. මේ අවස්ථාවේ දී නිශ්චිත අරමුණක් සාක්ෂාත් කර ගන්නා ආකාරයේ අරමුණු සීමා කිරීමක් පිළිබඳ පැහැදිලි අදහසක් නොමැත. අදහස ප්‍රවේශමෙන් විමර්ශනය කරමින්, ගැටලුව පිළිබඳ නිරතුරු ව ම වඩාත් කරුණු සෙවීම අවශ්‍ය ය. අනතුරුව කෙරෙන සැලසුම් පියවර සාර්ථක වේ නම්, අරමුණ සාක්ෂාත් කර ගන්නා ආකාරය පිළිබඳ සමස්ත සැලසුම හා එහි පළමු පියවර ක්‍රියාත්මක කිරීමට අදාළ වූ තීරණයට එළඹීමට අවස්ථාව උදා වේ.

සැලසුමේ පළමු පියවර ක්‍රියාත්මක කළ පසු එය පවතින්නේ අපේක්ෂිත මට්ටමට ඉහළින් ද, පහළින් ද යන්න ඇගයීම මගින් ඉදිරි පියවර නිවැරදි ලෙස ප්‍රතිසංවිධානය කර සැලසුම් කිරීමේ පදනම ගොඩ නැගීම, සමස්ත සැලසුම නවීකරණයට පදනමක් සැපයීම හා සැලසුම්කරුවන්ට ඉගෙනීමට අවස්ථා හඳුනා ගැනීමට එක්තරා ආකාරයකට කරුණු සොයා බැලීමක් කෙරේ(ලෙවින්, 1947). ලෙවින් අවධාරණය කරන පරිදි මෙම ක්‍රියාදාමයේ පදනම ප්‍රත්‍යවේක්ෂණයයි.


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1





*1 වන රූපය :* කුර්ත් ලෙවින්ගේ ක්‍රියාමූලික පර්යේෂණ ආකෘතිය: සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, කරුණු සොයා බැලීම

මූලාශ්‍රය : Levin, K. (1947). *Reading in Social Psychology*. New York: Henry Holt and Company. P332

පසුකාලීන ව කෙමිස් (1983), ඉබුට් (1985), එලියට් (1991), හොප්කින්ස් (1985) වැනි අය ලෙවින් ආකෘතිය විවිධ අයුරින් සංවර්ධනය කළ පිරිස අතර වෙති. බර්න්ස් (1996) ඉදිරිපත් කළ ආකෘතියේ, ක්‍රියාමූලික පර්යේෂණයක දැකිය හැකි පියවර අන්තර්ගත කළ හැකි ප්‍රධාන අවධි දෙකක් ඉතා පැහැදිලි ව පෙන්වා දී තිබේ. විනිශ්චයාත්මක අවධිය සහ චිකිත්සීය අවධිය එම අවධි දෙක ය. ගැටලුව හඳුනා ගෙන, ගැටලුව පිළිබඳ කරුණු සොයා බලා, ඒ අනුව ගැටලු විසඳීමට ගත යුතු ප්‍රධාන හා මූලික සැලැස්ම තීරණය කිරීමේ අවධිය, විනිශ්චයාත්මක අවධිය වේ. සකස් කර ගත් සැලැස්ම, එහි එක් එක් පියවර අනුව ක්‍රමානුකූල ව ක්‍රියාත්මක කරමින් එහි සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය නියාමනය කරමින් ඉදිරියට යාම චිකිත්සීය අවධිය වේ. මේ අනුව බර්න්ස් (1996) ආකෘතිය අනුව සැලසුම් කිරීමේ අවධිය රේඛීය ස්වරූපයක් ද චිකිත්සීය අවධියේ සර්පිලාකාර රටාවක් ද දක්නට ලැබේ.



Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1




*2 වන රූපය :* බර්න්ස් ආකෘතිය

මූලාශ්‍රය : Burns, R. B. (1996). Introduction to research methods. 3rded. South Melbourne: Longman

ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලියේ අත්‍යාවශ්‍ය අදියර වන  ගැටලුව හඳුනා ගැනීම, කරුණු සොයා බැලීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල ඇගයීම සහ ප්‍රත්‍යවේක්ෂණය යන පියවර සහිත චක්‍රීය ස්වරූපය සරල ම ආකාරයෙන් මතු සඳහන් ලෙස ඉදිරිපත් කළ හැකි ය. ක්‍රියාමූලික පර්යේෂණකරණයේ නිරත වන අධුනික පර්යේෂකයින්ට සරල ආකාරයෙන් පැහැදිලි කර දීම සුදුසු වන නමුත් ප්‍රත්‍යවේක්ෂණය සෑම පියවරක ම අනිවාර්ය අංගයක් බව පෙන්වා දීම වැදගත් ය. ඒ අනුව ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලිය ආශ්‍රිත ව මෙතෙක් ඉදිරිපත් කළ ආකෘති සලකා බලා, පොදුවේ ක්‍රියාමූලික පර්යේෂණ ආශ්‍රිත ආකෘතියක් පහත සඳහන් ලෙස ඉදිරිපත් කළ හැකි ය.




*3 වන රූපය :* ක්‍රියාමූලික පර්යේෂණයක පොදුවේ අන්තර්ගත විය යුතු පියවර සහිත ආකෘතිය


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

මෙසේ විවිධ ස්වරූපවලින් ක්‍රියමූලික පර්යේෂණ ආකෘති තිබුණ ද ගැටලුව හඳුනා ගැනීම, ඒ පිළිබඳ කරුණු සොයා බැලීම, සැලසුම් කිරීම, සැලසුම ක්‍රියාත්මක කිරීම සහ නියාමනය/ප්‍රතිඵල ඇගයීම යන පියවර ක්‍රියමූලික පර්යේෂණ ක්‍රියාවලියෙහි අඩංගු පියවර ය. මේ සෑම පියවරක දී ම වෘත්තීය සංවර්ධනය අරමුණු කර ගෙන නිරන්තර ප්‍රත්‍යවේක්ෂණයේ නිරත විය යුතු ය. එමගින් සාම්ප්‍රදායික ගුරු භූමිකාවෙන් මිදී තමාගේ සහ තමා අවට පාර්ශවයන්ගේ සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට නම් ඕනෑ ම වෘත්තිකයකු ක්‍රියාමූලික පර්යේෂණයක නිරත විය යුතු ය.

## ප්‍රත්‍යවේක්ෂණය (Reflection)

අත්දැකීම් ඇසුරින් ඉගෙනුමකි
(Spalding, 1998)

හොඳින් සිතාබැලීමකි
(Tickle, 1998)

ප්‍රත්‍යවේක්ෂණයයනු

ක්‍රියාව පිළිබඳ ආරම්භය සහ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධාත්මක ක්‍රමානුකූල, තර්කානුකූල සහ නිර්මාණාත්මක සිතීමකි
(Fish & Twinn, 1997)

ප්‍රත්‍යවේක්ෂණය ස්වකීය වෘත්තීය ව්‍යවහාරය වැඩි දියුණු කර ගැනීම සඳහා වූ ස්වයං පරීක්ෂාවක් සහ ස්වයං ඇගයීමක් සහිත ක්‍රියාවලියකි. එසේ ම ප්‍රත්‍යාවේක්ෂණ පෞද්ගලික සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ පුද්ගලයා තුළ අර්ථාන්විත වෙනසක් ඇති කිරීමට යොමු වූ ක්‍රියාවකි. එහෙයින් පෞද්ගලික සංවර්ධනය සඳහා විනයක් සහිත ව සිතාමතා චින්තනයේ නියැළීමක් ලෙස ද ප්‍රත්‍යවේක්ෂණය නිර්වචනය කළ හැකි ය.

**ප්‍රත්‍යාවේක්ෂණ**

- ඔබ තුළ පවතින ශක්‍යතා හා දුර්වලතා හඳුනා ගැනීමට
- අගයන් හා විශ්වාස සම්බන්ධයෙන් ඔබේ ප්‍රශ්නකරණය තේරුම් ගැනීමට
- ඔබේ අදහස් හා හැඟීම් සහ ක්‍රියාවන්ට පදනම් වන විය හැකි, ඔබ උපකල්පනය කරන අභියෝග පිළිබඳ දැනුවත්භාවය ඇති කර ගැනීමට
- ශක්තිමත් අගතීන් හෝ සංවර්ධනය වන ක්ෂේත්‍ර හඳුනා ගැනීමට
- ඇති විය හැකි අසම්පූර්ණ තත්ත්ව හඳුනා ගැනීමට උදව් දෙන ක්‍රියාවලියකි.

තෙ ආකාරයකින් ප්‍රත්‍යවේක්ෂණ කළ හැකි ය (Schon, 1973; 1983; 1987, Killion & Todnem,1991).


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

1. සමකාලීන ප්‍රත්‍යවේක්ෂණය (Reflection in action) - කාර්ය කරන අතර කරනු ලබන ප්‍රත්‍යවේක්ෂණය

   උදා ඃ ගුරුවරයකු කිසියම් සංකල්පයක් පැහැදිලි කරන විට භාවිත කරන වචන ළමයින්ට ගැළපේ දැයි පැහැදිලි කරන අතර ම සිතා බැලීම

2. පසුකාලීන ප්‍රත්‍යවේක්ෂණය (Reflection on action) - කාර්ය කළ පසු කරනු ලබන ප්‍රත්‍යවේක්ෂණය

   උදා ඃ පාඩමින් පසු අභ්‍යාසයක් නිවැරදිව නොකිරීමට හේතු ගුරුවරයා විසින් සිතා බැලීම

3. ක්‍රියාව සඳහා ප්‍රත්‍යවේක්ෂණය (Reflection for action)

   උදා ඃ පාඩම වඩා හොඳින් ඉගැන්වීමට සැලසුම් කිරීම සඳහා ඒ ගැන සිතිවිල්ල යොමු කිරීම

පර්යේෂණවල දී බහුල වශයෙන් දත්ත රැස් කිරීමට යොදාගන්නා ක්‍රමවේද අතර වන නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ක්‍රියාමූලික පර්යේෂණවල දී ද යොදා ගැනේ. විශේෂයෙන් ක්‍රියාමූලික පර්යේෂණවල දී දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස මෙන් ම ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලියේ අත්‍යාවශ්‍ය අදියරක් වන ප්‍රත්‍යවේක්ෂණය සඳහා

- **පෞද්ගලික ලුහුඬු සටහන් (personal action logs)**

  සුවිශේෂ කාල පරාසයක් තුළ පර්යේෂකයා විසින් ක්‍රියාකාරකම් සහ කාර්ය පිළිබඳ සටහන් තබා ගැනීමට යොදා ගත හැකි පෞද්ගලික සටහන් ගොනුවකි/මාලාවකි (sheets).

  උදා: දිනක් හෝ සතියක් තුළ වාර්තා තබන අත්‍යවශ්‍ය පුද්ගල හැසිරීම්

- **සංවාදාත්මක ජර්නලය (Dialogue Journals)**

  අදහස් හුවමාරුවට හෝ ප්‍රත්‍යවේක්ෂණයට යොදා ගන්නා ලුහඬු සටහන් (log) හෝ සටහන් පොතකි (note book).

- **දිනපොත් වර්ග (Diaries)**

  දිනපොත නිරීක්ෂණය, හැගීම්, ආකල්ප, සංජානන, ප්‍රත්‍යවේක්ෂණ, කල්පිත, දීර්ඝ වූ විශ්ලේෂණ සහ රහස්‍ය යෝජනා අන්තර්ගත වේ. විශේෂයෙන් ක්‍රියාමූලික පර්යේෂණය අරමුණු කරගෙන දිනපොත් පෞද්ගලික ලේඛනයක් වශයෙන් වැදගත් හැගීම්, අදහස්, විස්තරාත්මක ව වාර්තා කරන ක්‍රමවේදයක් යොදාගත හැකි උපකරණයකි. ගුරුවරයා සංවර්ධනය කිරීමට අදහස් කරන, අවධානයෙන් සිටින කරුණු වෙනස් වීම, ප්‍රගතිය සහ ශිෂ්‍ය ප්‍රතිපායනය ආදී සියල්ල කැටිකර ගත් දත්ත ඇතුළත් වාර්තාවක් ලෙස දින පොත දැක්විය හැකි ය.

- **ගුරු ජර්නල්**

  ගුරුවරයාගේ වෘත්තීය ක්‍රියාකාරකම් ප්‍රත්‍යවේක්ෂණ සටහන් ගොනුවක් ලෙස භාවිත කළ හැකි ය. නිරීක්ෂණයෙන් පමණක් නොව, හැඟීම් සහ ප්‍රත්‍යවේක්ෂණ සමග නිරීක්ෂණය සම්බන්ධ කරමින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ අවංක


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

සුවිශේෂ සහ භාෂාමය වශයෙන් බලසම්පන්න භාවයෙන් යුක්තව ලබා ගත හැකි ක්‍රමයකි.

යොදා ගත හැකි ය.

ප්‍රත්‍යවේක්ෂණ සටහන් කර ගත හැකි ආකෘති සඳහා නිදසුන්.

1 වැනි ආකෘතිය

| **දිනය හා වේලාව** | **නිරීක්ෂණ/ක්‍රියාකාරකම් ගැන සටහන්** | **ප්‍රත්‍යවේක්ෂණය** |
|---|---|---|
| | | |

2 වැනි ආකෘතිය

| කළේ කුමක් ද? | සිදුවූයේ කුමක් ද? | සිදුවීම ගැන සිතන්නේ කුමක් ද? | සිදුවීමෙන් උගත්තේ කුමක් ද? |
|---|---|---|---|
| | | | |

## ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාදාමය

1. **ගැටලුව හඳුනා ගැනීම**

   නාභිගත ගැටලුව ප්‍රකාශයක් ලෙස ලියා එය පැහැදිලි ව විස්තර කරන්න

2. **ගැටලුව පිළිබඳ කරුණු සොයා බැලීම**

   සමීප හා ශාස්ත්‍රීය සංදර්භය (context) ඇසුරින් ගැටලුව පිළිබඳ අවබෝධය පුළුල් කර ගැනීම.

3. **සැලසුම් කිරීම**

   ගැටලුව විසඳීමට සුදුසු ක්‍රියාමාර්ග සොයා බලා ඉන් වඩාත් උචිත ඵලදායී ක්‍රියාමාර්ගයක් තෝරා ගෙන සැලසුම් කිරීම.

4. **සැලසුම ක්‍රියාත්මක කිරීම**

   සැලසුම ක්‍රියාවට නැගීමෙන් ගැටලුව විසඳීමට මැදිහත් වීම.

5. **සැලසුම ක්‍රියාත්මක කිරීම නියාමනය/අර්ථකථනය හා ඉදිරි පියවරට ප්‍රවේශවීම**

   සැලසුමේ පළමු පියවර ක්‍රියාත්මක කරමින් එයට අදාළ දත්ත එක් රැස් කිරීම, සාක්ෂි එකතු කිරීම, දත්ත විශ්ලේෂණය, දත්ත අර්ථකථන ක්‍රියා ආශ්‍රිත තොරතුරු සිදු කරමින් සැලසුම ක්‍රියාත්මක කිරීමේ කාර්ය අභිමන්ත්‍රණය (Monitor) කිරීම.


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

**6. ප්‍රති සැලසුම් කිරීම**

සැලසුමේ පළමු පියවර ක්‍රියාත්මක කිරීමෙන් ලැබූ ප්‍රතිඵල මත එම සැලසුමේ ඉදිරි පියවර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාමාර්ගය වෙනස් කිරීමට වැඩි දියුණු කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ග සැලසුම් කිරීමට හැකියාව ඇත. ඉන්පසු එම නව සැලසුම් හා එහි පියවර පෙර පරිදි ක්‍රියාත්මක කරමින් අදාළ ඉලක්කය වෙත ළඟා වීමට කටයුතු කිරීම.

**7. වාර්තාකරණය හා ප්‍රසිද්ධ කිරීම**

ප්‍රත්‍යක්ෂ කර ගත් ව්‍යවහාරික දැනුම ප්‍රජාවට සංනිවේදනය කිරීම

**ප්‍රත්‍යවේක්ෂණය**

තමා ගැටලුව හඳුනා ගෙන, එය විසඳීමට සුදුසු ක්‍රියා මාර්ග සැලසුම් කර, ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් ඒ නිසා තමාගේත් පර්යේෂණයට බඳුන් වූ පිරිසගේත් වූ වෙනස කවර ආකාර ද යන්න පිළිබඳ ප්‍රත්‍යාවේක්ෂණයේ යෙදීම.

**පර්යේෂණ ක්‍රියාදාමයේ සෑම පියවරක් ම ප්‍රත්‍යවේක්ෂණ මගින් පෝෂණය විය යුතු ය.**

## ක්‍රියාමූලික පර්යේෂණ යෝජනාව

1. ඔබ හඳුනාගත් ගැටලුව
   ගැටලුව ඔබේ භූමිකාවට බලපාන ආකාරය
   ගැටලුව වැඩිදුරත් සොයා බැලීමේ අවශ්‍යතාව
2. ගැටලුව පිළිබඳ කරුණු සොයා බැලීමට යෝජිත ක්‍රම
   - පංති කාමර ලේඛන ඇසුරින් තොරතුරු රැස් කිරීම
     උදාඃ- අභ්‍යාස පොතෙහි සටහන් අනුපිළිවෙලට තබා ගැනීම
   - සම්මුඛ සාකච්ඡා
     උදාඃ- දෙමාපියන් සමග සම්මුඛ සාකච්ඡා
   - නිරීක්ෂණය
     උදාඃ- අභ්‍යාස පොත පරිහරණය කරන ආකාරය
   - ශාස්ත්‍රීය පොතපත, පූර්ව පර්යේෂණ වැනි ලේඛන ඇසුරින් තොරතුරු රැස් කිරීම වැනි ක්‍රම
3. ප්‍රධාන පර්යේෂණ ප්‍රශ්නය හා සුවිශේෂී පර්යේෂණ ප්‍රශ්න
4. අනුගමනය කිරීමට අපේක්ෂිත ආචාර ධර්ම
5. පර්යේෂණ සීමා
6. එක් එක් සුවිශේෂී පර්යේෂණ ප්‍රශ්නය විසඳීමට යෝජිත ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග සහ අවශ්‍ය සම්පත්
7. කාල රාමුව
8. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

## ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාව ලිවීම සඳහා පොදු උපදෙස්

වාර්තා අන්තර්ගතයේ පහත සඳහන් ගුණාංග අඩංගු විය යුතු ය

- ඔබේ වෘත්තිය භූමිකාවට අදාළ ඔබේ කතාන්තරය (your story) ශාස්ත්‍රීය ලේඛන ශෛලිය අනුගමනය කර ලියන්න
- උත්තම පුරුෂ අඛ්‍යානයෙන් ලියන්න
- ගැටලුවට අදාළ නම් ප්‍රමාණාත්මක දත්ත, වගු, ප්‍රස්තාර ඇතුළත් කළ හැකි ය
- පර්යේෂණයෙන් වන සංවර්ධනය තෙයාකාර ව පැහැදිලි විය යුතු ය
    - පර්යේෂකගේ ස්වයං වෘත්තීය සංවර්ධනය (පර්යේෂණ ක්‍රියාවලියේ නිරත වීම නිසා තමාගේ සංවර්ධනය වූ දෑ ප්‍රත්‍යවේක්ෂණ සහිත ව පැහැදිලි කළ යුතු ය.)
    - පර්යේෂණයේ ඉලක්ක කණ්ඩායමේ සංවර්ධනය
    - පාසල සහ අධ්‍යාපන ආයතනවල වූ සංවර්ධනය

# ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාවේ ව්‍යූහය

ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාවක ප්‍රධාන වශයෙන් කොටස් තුනකි.

**පළමු වැනි කොටස** - මුල් පිටු
**දෙ වැනි කොටස** - අන්තර්ගතය
**තෙ වැනි කොටස** - අග පිටු

## මුල් පිටු

- වාර්තාවේ නම, ශිෂ්‍යයා පිළිබඳ තොරතුරු, පාඨමාලාව, හා අධ්‍යයන වර්ෂය ඇතුළත් මුල් පිටුව
- ප්‍රකාශය
- ස්තුතිය
- පටුන
- වගු නාමාවලිය හා රූප නාමාවලිය
- සංක්ෂිප්තය

## අන්තර්ගතය

1. **හැඳින්වීම**
    - මුහුණ පෑ ගැටලුව සඳහන් කර ගැටලුව ලියා එය පැහැදිලි කිරීම
    - ගැටලුවට සම්බන්ධ පාර්ශ්ව (ශිෂ්‍යයන්/ගුරුවරුන්/දෙමාපියන්)
    - මා මුහුණ දුන් ගැටලුව මගේ භූමිකාවට සම්බන්ධ වන අයුරු
    - ගැටලුව පිළිබඳ මගේ මතය/දැක්ම/චින්තාව


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

- පර්යේෂකයා අසතුටට හෝ කලකිරීමට පත් කළ ගැටලුව පිළිබඳ වඩා පැහැදිලි අවබෝධයක් ලබාදීම සඳහා පර්යේෂකයා (මා) අත්දුක ඇති තත්ත්වයන් ඉදිරිපත් කිරීම. එය තම භූමිකාවට සම්බන්ධ වන ආකාරය සහ ඒ පිළිබඳ පර්යේෂකයාගේ අදහස් හා දැක්ම ගොඩනගා ගත් අනුමාන හා ඒ සඳහා යෝජනා කරන තාවකාලික විසඳුම්.

**2. ගැටලුව පිළිබඳ කරුණු සොයා බැලීම**

**i. සමීප සන්දර්භය**

- ගැටලුවට සම්බන්ධ පාර්ශව සමග සම්මුඛ සාකච්ඡා, පන්ති කාමර නිරීක්ෂණ, පන්ති කාමර/පාසල් ලේඛන මූලාශ්‍ර විග්‍රහය වැනි දෑ ඇසුරින් ගැටලුව හා බැඳුණු පරිසර සාධක හඳුනා ගැනීම. මෙහි දී ගැටලුව ඇති වූ පරිසරය හා එහි සමාජිකයන් ගැටලුව දකින, අත්දකින ආකාරය පැහැදිලි කෙරේ.
- උක්ත පැහැදිලි කිරීම් සමඟ මගේ අදහස් ගැළපේ ද? නැති නම් මගේ අදහස් වෙනස් කිරීමට එම පැහැදිලි කිරීම උපකාරී වී ද?

**ii. ශාස්ත්‍රීය සන්දර්භය**

- සමීප සන්දර්භයෙන් මතු වූ කරුණු අධ්‍යාපනය පිළිබඳ න්‍යායයාත්මක කරුණු හෙවත් පර්යේෂණ සාහිත්‍යය මගින් තවදුරටත් පැහැදිලි හා තහවුරු කර ගැනීම. මගේ පවත්නා ශාස්ත්‍රීය දැනුම සහ මට පහසුවෙන් සම්බන්ධ කර ගැනීමට, ලබා ගැනීමට හැකි ලේඛන, පර්යේෂණ, මූලාශ්‍ර, පොත පත වැනි දෑ ආශ්‍රයෙන් ගැටලුව සහ පර්යේෂකයාගේ අවබෝධය පුළුල් කර ගෙන විසඳුම් හඳුනා ගැනීමට පසුබිම සකසා ගැනීම.

*මූලාශ්‍රය : ජාතික අධ්‍යාපන ආයතනය. (2011). ක්‍රියාමූලික පර්යේෂණ අත්පොත - පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව.*

**3. සුවිශේෂ ප්‍රශ්න/ සුවිශේෂ අරමුණු**

කරුණු සොයා බැලීමෙන් පසු ගැටලුවට අදාළ සුවිශේෂ ප්‍රශ්න හෝ සුවිශේෂ අරමුණු හඳුනා ගත යුතු ය (උපරිම සංඛ්‍යාව පාඨමාලාව අනුව වෙනස් වේ).

**4. සැලසුම**

සුවිශේෂ අරමුණු ඉටු කර ගැනීම සඳහා පොදු සැලැස්ම සහ සැලැසුමේ අනුපියවර සැකසීම ගැටලුව විසඳීමේ සමීප සන්දර්භය සහ ශාස්ත්‍රීය සන්දර්භය පදනම් කර ගෙන මා හඳුනා ගත් ගැටලුව විසඳීමෙහි ලා යොදා ගත හැකි පොදු සැලැස්මක් හඳුනා ගැනීම, සකසා ගැනීම හා සැලැස්මේ අනුපියවර සැකසීම (සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාළ ව සැලැසුම් පියවර හා අනුපියවර ගණනාවක් තිබිය හැකි ය). සැලසුම මාස කිහිපයක් තුළ ක්‍රියාත්මක වන්නක් විය හැකි ය. නැත හොත් සතියකට, සති කිහිපයකට සීමා වූ කෙටි කාලීන සැලැස්මක් විය හැකි ය.

**5. සැලසුමේ එක් එක් පියවර ක්‍රියාත්මක කිරීම, අවශ්‍ය නම් ප්‍රතිසැලසුම් කිරීම සහ ප්‍රත්‍යවේක්ෂණ**

පියවර 1

පියවර 2 ආදී වශයෙන් සැලැස්මේ පියවර ක්‍රියාත්මක කළ අයුරු විග්‍රහ කරන්න.


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

සැලැස්මේ පියවරක් අසාර්ථක වී ප්‍රති සැලසුම් කර ක්‍රියාත්මක කළේ නම් ඒ පිළිබඳ තොරතුරු ද ඇතුළත් විය යුතු ය.

**6. ආචාරධර්ම සුරකිමින් පර්යේෂණය ක්‍රියාත්මක කළ ආකාරය**

ක්‍රියාමූලික පර්යේෂණ ස්වභාවය අනුව පර්යේෂකයා විවිධ පුද්ගලයන් සමග අන්තර් සබඳතා පැවැත්වීමට සිදු වේ. එහි දී අනුගමනය කළ යුතු ආචාරධර්ම සඳහන් කළ යුතු ය.

**7. අවසාන අනාවරණ සහ ප්‍රත්‍යවේක්ෂණ ඉදිරිපත් කිරීම**

- උක්ත පර්යේෂණ ක්‍රියාවලිය යටතේ මා ගැටලුව විසඳා ගත් ආකාරය
- උක්ත ගැටලුව විසඳා ගත් ආකාරයෙන් මගේ වෘත්තීය සංවර්ධනයට ලද ආලෝකය/ මට ලැබුණු නව දැනුම/ මතු කර ගත් හෝ ගොඩ නගා ගත් ව්‍යවහාරික දැනුම
- මගේ සේවා දායකයන්ට ලැබුණු යහපත
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති කළ හැකි වූ වෙනස සහ යෝජනා

## අග පිටු

- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය
- ඇමුණුම් හෝ උපග්‍රන්ථ
- අනුමැතිය ලබා ගත් පර්යේෂණ යෝජනාව


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

# ක්‍රියාමූලික පර්යේෂණ අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා තාක්ෂණික උපදෙස්

## පිරියත ස්වභාවය (Layout)

**මූලික කරුණු**

- පොත මුද්‍රණය සඳහා (A4) සුදු මුද්‍රණ කඩදාසි (gms 80) පමණක් භාවිත කිරීම.
- අභ්‍යන්තර පිටු සැකසුම් පරිමාණය (Margins) පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| ඉහළ - | 1 Inch | වම් පස - | 1.5 Inch |
| පහළ - | 1 Inch | දකුණු පස - | 1 Inch |

**වසුන (පිට කවරය)**

- පසුබිම වර්ණය : පාඨමාලාව අනුව වෙනස් වේ.
- කඩදාසිය : අන්තර්ජාතික සම්මත පරිමාණයට අනුව A4 ප්‍රමාණයේ මුද්‍රණ කඩදාසි ආවරණයට සුදුසු ඝන කවරයක් (Hard Binding)
- අක්ෂර වර්ගය : FMAbabld/Kalaham/Times new Roman

- අක්ෂර වර්ණය : රන් පැහැය
- අක්ෂර ප්‍රමාණය : (Font size)
  - පර්යේෂණ වාර්තාවේ මාතෘකාව : 28 තද කළු ( FMAbabld)
    (ඉහළ මැදට වන පරිදි අන්තර්ගත කළ යුතු ය).
  - පර්යේෂකගේ නම : 18
  - ලියාපදිංචි අංකය : 16
    මැදට වන පරිදි අන්තර්ගත කළ යුතු ය.
  - පාඨමාලාවේ නම : 16
  - අධ්‍යයන වර්ෂය/වර්ෂ : 16
    (මැදට වන පරිදි සඳහන් විය යුතු ය).
  - දෙපාර්තමේන්තුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ නම සහ අධ්‍යයන වර්ෂය
    (පහළ මැදට වන පරිදි සඳහන් විය යුතු ය).
    (උදාහරණ සඳහා 1 වැනි ඇමුණුම බලන්න)

**වාර්තාවේ ප්‍රධාන කොටස් තුන සඳහා පිරියත උපදෙස්**

**මුල් පිටු සැකසුම**

පිටු අංකනය : රෝම ඉලක්කම් (පිටුවේ පහළ මැදට වන්නට)


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

- පිටු අංකය i : වාර්තාවේ මාතෘකාව, ශිෂ්‍ය තොරතුරු, පාඨමාලාව හා අධ්‍යයන වර්ෂය, ආයතනය, යන කරුණු ඇතුළත් පිටුව (උදාහරණ සඳහා 1 වැනි ඇමුණුම බලන්න)
- පිටු අංකය ii : ප්‍රකාශය (උදාහරණ සඳහා 2 වැනි ඇමුණුම බලන්න)
- පිටු අංකය iii : ස්තුතිය
- පිටු අංකය iv : පටුන
- පිටු අංකය v : වගු නාමාවලිය
- පිටු අංකය vi : රූප නාමාවලිය
- පිටු අංකය vii : සංක්ෂිප්තය (පිටුවකට සීමා විය යුතු ය)

**ඇතුළත පිටු සැකසුම**

පිටු අංකනය : හින්දු අරාබි ඉලක්කම් (පිටුවේ පහළ මැදට වන්නට)

- මාතෘකා යෙදීමේ දී
  - ප්‍රධාන මාතෘකා : අකුරු ප්‍රමාණය 16, අක්ෂර වර්ගය FMAbabld
  - අනු මාතෘකා : අකුරු ප්‍රමාණය 14, අක්ෂර වර්ගය FMAbabld
  - අනු අනු මාතෘකාව : අකුරු ප්‍රමාණය 12, අක්ෂර වර්ගය FMAbabld
- අන්තර්ගතය : අකුරු ප්‍රමාණය 12, අක්ෂර වර්ගය FMAbhaya
- පේළි දෙකක් අතර පරතරය : 1.5 (Space)
- ඡේද අතර පරතරයක් (Space) නො තැබීම

  (උදාහරණ සඳහා 3 වැනි ඇමුණුම බලන්න)

**අග පිටු සැකසුම**

පිටු අංකනය : ඇතුළත පිටු අංකනය අවසන් වූ පිටු අංකනයේ සිට හින්දු අරාබි ඉලක්කම් (පිටුවේ පහළ මැදට වන්නට)

- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ඇමරිකානු මනෝ විද්‍යාත්මක සංගමයේ (APA) උපදෙස් අනුව (උදාහරණ සඳහා පිටු අංක 28 බලන්න)
- ඇමුණුම් හෝ උපග්‍රන්ථ
- අනුමැතිය ලබා ගත් පර්යේෂණ යෝජනාව
- පර්යේෂණ උපදේශක වාර්තාව

- නිබන්ධයේ අවම වචන සංඛ්‍යාව - පාඨමාලා අරමුණු අනුව වෙනස් වේ (පරිගණක ගත කළ යුතු ය).


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

# ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාව ඇගැයීම් පටිපාටිය

ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

**පළමු වැනි කොටස** - වාර්තාවේ අන්තර්ගතය (80%)

**දෙ වැනි කොටස** - වාර්තාවේ තාක්ෂණ සහ පිරියත ලක්ෂණ (20%)

**පර්යේෂණ වාර්තාවේ අන්තර්ගතය (80%)**

- හැඳින්වීම 10%
- ගැටලුව පිළිබඳ කරුණු සොයා බැලීම 10%
- සුවිශේෂ ප්‍රශ්න/ සුවිශේෂ අරමුණු 05%
- සැලසුම හා එහි පියවර 10%
- සැලසුම ක්‍රියාත්මක කිරීම, ප්‍රතිසැලසුම් කිරීම සහ ප්‍රත්‍යවේක්ෂණ 30%
- අවසාන අනාවරණ සහ ප්‍රත්‍යවේක්ෂණ ඉදිරිපත් කිරීම 10%
- වෘත්තීය සංවර්ධනයට දායකත්වය සහ ගොඩ නගා ගත් ව්‍යවහාරික දැනුම 05%

**පර්යේෂණ වාර්තාවේ තාක්ෂණික ලක්ෂණ (20%)**

- භාෂාව නිවැරදි ව හැසිරවීම
- මුද්‍රණ දෝෂවලින් තොර වීම
- මුල් පිටු අනුපිළිවෙලින් තිබීම
- උපග්‍රන්ථයෙහි ඇමුණුම් සුදුසු ලෙස අනුපිළිවෙළින් තිබීම
- මූලික තාක්ෂණික උපදෙස් පිළිපැදීම
    - අකුරෙහි ප්‍රමාණය
    - ඡේද අතර, පේළි අතර පරතරය වැනි කරුණු

පර්යේෂණ වාර්තාව ඇගයීමේ දී අවධාරණය යොමු කළ යුතු මට්ටම් අනුව ක්‍රමයෙන් ගුණාත්මක බව වැඩි දියුණු වන පරිදි නිර්ණායක මට්ටම් හතරක් යටතේ ඉදිරිපත් කර තිබේ.

**පළමු මට්ටම** - දුර්වලය (Low) - සමස්ථ නිබන්ධය ම සංශෝධනය කළ යුතු ය

**දෙ වැනි මට්ටම** - සාමාන්‍යය (Fair) – සංශෝධනවලට යටත් ය

**තුන්වන මට්ටම** - අපේක්ෂිත මට්ටමට පවතී (Above avarage)

**හතරවන මට්ටම** - විශිෂ්ට මට්ටම (Excellent)

උක්ත නිර්ණායක අනුව ලකුණු පැවරීමට යොමු වීම ඇගයීමේ සංගත බව ආරක්ෂා කිරීමට හේතු වේ. ඇගයීම අවසානයේ වාර්තාවෙහි අන්තර්ගතයේ එක් එක් අංශය සහ වාර්තාවේ තාක්ෂණික ලක්ෂණ ආශ්‍රිතව ඇගයුම්කරුගේ විමර්ෂණ සටහන් සහ නිර්දේශ


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

ඉදිරිපත් කිරීම ද වැදගත් ය (උදාහරණ සඳහා 4 වැනි ඇමුණුම බලන්න). ඇගයීම් කටයුතුවල දී සුවිශේෂව අවධානය යොමු කළ යුතු කරුණකි. එනම් වාර්තාවේ අන්තර්ගතය නිර්ණායකවලට අනුව අපේක්ෂිත මට්ටමේ පැවතිය ද, තාක්ෂණ සහ පිරියත දෝෂ බහුල නම්, අනිවාර්යයෙන් එකී සංශෝධන ඇතුළත් කර පර්යේෂණ වාර්තාව නැවත භාර දිය යුතු ය.


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

# ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාව ඇගැයීම් නිර්ණායක

| ඇගැයීම් නිර්ණායක | පළමු මට්ටම | දෙවන මට්ටම | තුන්වන මට්ටම | හතරවන මට්ටම |
|---|---|---|---|---|
| හැඳින්වීම (පර්යේෂණ ගැටලුව) | 1.1.1 ගැටලුව පැහැදිලිව විස්තර නොවීම හෝ නොකිරීම<br>1.1.2 පර්යේෂණ ගැටලුව ක්‍රියාමූලික පර්යේෂණයකට යෝග්‍යය නොවේ.<br>1.1.3 ගැටලුව වෘත්තීය භූමිකාවට සම්බන්ධ නැත<br>1.1.4 පර්යේෂණ ගැටලුව ප්‍රායෝගිකත්වයෙන් මතුවූ බව පැහැදිලි නොවේ.<br>1.1.5 පර්යේෂණ ගැටලුව විසඳීමේ අවශ්‍යතාව විස්තර කර නැත. | 1.2.1 ගැටලුව පැහැදිලි කර තිබුණ ද හොඳින් විස්තර නොකිරීම<br>1.2.2 පර්යේෂණ ගැටලුව යම් තරමකට ක්‍රියාමූලික පර්යේෂණයකට යෝග්‍ය ය.<br>1.2.3 ගැටලුව යම් තරමකට වෘත්තීය භූමිකාවට සම්බන්ධය.<br>1.2.4 පර්යේෂණ ගැටලුව ප්‍රායෝගිකත්වයෙන් මතුවූ බව පැහැදිලි වේ. නමුත් අවම මට්ටමෙනි.<br>1.2.5 පර්යේෂණ ගැටලුව විසඳීමේ අවශ්‍යතාව යම් තරමකට විස්තර කර තිබේ. | 1.3.1 පර්යේෂණ ගැටලුව පැහැදිලි ව විස්තර වේ.<br>1.3.2 පර්යේෂණ ගැටලුව ක්‍රියාමූලික පර්යේෂණයකට යෝග්‍ය ය.<br>1.3.3 ගැටලුව වෘත්තීය භූමිකාවට සම්බන්ධ ය.<br>1.3.4 පර්යේෂණ ගැටලුව ප්‍රායෝගිකත්වයෙන් මතුවූවක් බව පැහැදිලි වේ.<br>1.3.5 පර්යේෂණ ගැටලුව විසඳීමේ අවශ්‍යතාව පැහැදිලිව විස්තර කර තිබේ. | 1.4.1 පර්යේෂණ ගැටලුව ඉතා හොඳින් පැහැදිලි ව විස්තර වේ.<br>1.4.2 පර්යේෂණ ගැටලුව ක්‍රියාමූලික පර්යේෂණයකට යෝග්‍ය ය.<br>1.4.3 පර්යේෂණ ගැටලුව වෘත්තීය භූමිකාවට ඍජුව ම සම්බන්ධ ය.<br>1.4.4 පර්යේෂණ ගැටලුව ප්‍රායෝගිකත්වයෙන් මතු කර ගත් අර්ථවත් ගැටලුවක් බව හොඳින් පිළිබිඹු වේ.<br>1.4.5 පර්යේෂණ ගැටලුව විසඳීමේ අවශ්‍යතාව පැහැදිලිව හා තර්කානුකූල ව විස්තර කර තිබේ. |
| ලකුණු | 0-2 | 3-5 | 6-8 | 9-10 |
| ගැටලුව පිළිබඳ කරුණු සොයා බැලීම | 2.1.1 පර්යේෂණ ගැටලුවට අදාළ ව කර නැත. | 2.2.1 පර්යේෂණ ගැටලුවට අදාළ ව කර ඇත. එහෙත් පර්යේෂණ ගැටලුව සමඟ පැහැදිලි සබඳතාවක් | 2.3.1 පර්යේෂණ ගැටලුවට අදාළ ව කර ඇත. පර්යේෂණ ගැටලුව සමඟ පැහැදිලි සබඳතාවක් | |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

| | | | | |
|---|---|---|---|---|
| | | ගොඩනගා නැත. | ගොඩනගා ඇත. | |
| | 2.1.2 සමීප සන්දර්භය හා ශාස්ත්‍රීය සන්දර්භය යටතේ කරුණු දක්වා නැත. | 2.2.2 සමීප සන්දර්භය හා ශාස්ත්‍රීය සන්දර්භයෙහි වෙනස පැහැදිලි වන පරිදි කරුණු දක්වා ඇත. | 2.3.2 සමීප සන්දර්භය හා ශාස්ත්‍රීය සන්දර්භය පර්යේෂණ ගැටලුව පිළිබඳ අවබෝධය පුළුල් කර ගැනීම පදනම් ව, කරුණු දක්වා ඇත. | 2.4.1 සමීප සන්දර්භය හා ශාස්ත්‍රීය සන්දර්භය පර්යේෂණ ගැටලුව පිළිබඳ අවබෝධය පුළුල් කර ගැනීම පදනම් ව, පර්යේෂණ ගැටලුව සමඟ පැහැදිලි සබඳතාවක් ගොඩනැගෙන ලෙස ඉදිරිපත් කර තිබේ. |
| | 2.1.3 කරුණු සොයා බැලීමට උචිත ක්‍රම ශිල්ප/ ක්‍රම ශිල්ප කිසිවක් භාවිත කර නැත. | 2.2.3 කරුණු සොයා බැලීමට උචිත ක්‍රම/ක්‍රම ශිල්ප භාවිත කර ඇත්තේ අවම මට්ටටමනි. | 2.3.3 කරුණු සොයා බැලීමට උචිත ක්‍රම ශිල්ප භාවිත කර තිබේ. | 2.4.2 කරුණු සොයා බැලීමට උචිත ම බහුවිධ ක්‍රම ශිල්ප භාවිත කර තිබේ. |
| | 2.1.4 අධ්‍යයනයේ මැදිහත්වීමේ සැලසුමට යොමුවක් සහිත ව කරුණු ඉදිරිපත් කර නැත. | 2.2.4 අධ්‍යයනයේ මැදිහත්වීමේ සැලසුමට තරමක යොමුවක් සහිත ව කරුණු ඉදිරිපත් කර තිබේ. | 2.3.4 අධ්‍යයනයේ මැදිහත්වීමේ සැලසුමට යොමුවක් සහිත ව කරුණු ඉදිරිපත් කර තිබේ. | 2.4.3 අධ්‍යයනයේ මැදිහත්වීමේ සැලසුමට අර්ථවත් මනා යොමුවක් සහිත ව කරුණු ඉදිරිපත් කර තිබේ. |
| | 2.1.5 මැදිහත්වීම් ක්‍රියාවලිය සහ තක්සේරු සැලසුමට සබඳතාවයක් නැත. | 2.2.5 මැදිහත්වීම් ක්‍රියාවලිය සහ තක්සේරු සැලසුමට තරමක යොමුවක් සහිත ව කරුණු සොයා බලා තිබේ. | 2.3.5 අරමුණු සහගතව, මැදිහත්වීම් ක්‍රියාවලිය සහ තක්සේරු සැලසුමට මඟ පෙන්වීමක් ඇතිවන පරිදි කරුණු සොයා බලා ඉදිරිපත් කර තිබේ. | 2.4.4 අරමුණු සහගතව, කරුණු සංස්ලේෂණය කර මැදිහත්වීම් ක්‍රියාවලිය සහ තක්සේරු සැලසුමට අර්ථවත් මඟ පෙන්වීමක් ඇතිවන පරිදි කරුණු සොයා බලා ඉදිරිපත් කර |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

| | | | | |
|---|---|---|---|---|
| | 2.1.6 පර්යේෂණ සන්ධර්භය පිළිබිඹු වන පරිදි කරුණු සොයා බලා නැත. | 2 .2.6 පර්යේෂණ සන්දර්භය පිළිබිඹු වන්නේ අවම වශයෙනි. | 2.3.6 පර්යේෂණ සන්දර්භය පිළිබිඹු වේ. | තිබේ.<br>2.4.5 පර්යේෂණ සන්දර්භය ඉතා හොඳින් පිළිබිඹු වේ. |
| **ලකුණු** | **0-2** | **3-5** | **6-8** | **9-10** |
| **සුවිශේෂ ප්‍රශ්න/ සුවිශේෂ අරමුණු** | 3.1.1 ගැටලුව සුවිශේෂ කර ගෙන විසඳුමක් ලබා ගත හැකි පරිදි පර්යේෂණ ප්‍රශ්න / අරමුණු ගොඩ නගා නැත. | 3.2.1 ගැටලුව තරමක් සුවිශේෂ කර ගෙන විසඳුමක් ලබා ගත හැකි පරිදි පර්යේෂණ ප්‍රශ්න / අරමුණු ගොඩ නගා ඇත. | 3.3.1 ගැටලුව සුවිශේෂ කර ගෙන විසඳුමක් ලබා ගත හැකි පරිදි සුවිශේෂ ව පර්යේෂණ ප්‍රශ්න / අරමුණු ගොඩ නගා ඇත. | 3.4.1 කරුණු සොයා බැලීමේ ප්‍රතිඵලය මත පදනම් ව ගැටලුව සුවිශේෂ කර ගෙන පර්යේෂණ ප්‍රශ්න / අරමුණු සුවිශේෂව ගොඩනගා ඇත. |
| **ලකුණු** | **0** | **1-2** | **3-4** | **5** |
| **සැලසුම සහ එහි පියවර** | 4.1.1 සැලසුම හා එහි පියවර නිශ්චිත ව දක්වා නැත.<br><br>4.1.2 ක්‍රියාකාරකම් සැලසුම, එහි පියවර සහ තක්සේරු | 4.2.1 සැලසුම හා එහි පියවර නිශ්චිත ව හා ගැටලුව විසඳීමට පදනමක් ලෙස දක්වා ඇත.<br><br>4.2.2 ක්‍රියාකාරකම් සැලසුම, එහි පියවර සහ තක්සේරු | 4.3.1 සැලසුම හා එහි පියවර කරුණු සොයා බැලීම පදනම් කර ගෙන පර්යේෂණ ප්‍රශ්න/අරමුණු අනුව නිශ්චිත ව හා ගැටලුව විසඳීමට පදනමක් ලෙස දක්වමින් පැහැදිලිව හා ක්‍රමානුකූලව ඉදිරිපත්වී ඇත.<br><br>4.3.2 ක්‍රියාකාරකම් සැලසුම, එහි පියවර සහ තක්සේරු | 4.4.1 සැලසුම හා එහි පියවර කරුණු සොයා බැලීම පදනම් කර ගෙන, පර්යේෂණ ප්‍රශ්න/අරමුණු අනුව පරිපූර්ණ ව, මනාව දත්ත ඉදිරිපත් කරමින්, හේතු දක්වමින් සංවර්ධනය කර තිබේ. නිශ්චිත ව, පැහැදිලිව හා ක්‍රමානුකූලව ඉදිරිපත්වී ඇත.<br><br>4.4.2 ක්‍රියාකාරකම් සැලසුම, එහි පියවර සහ තක්සේරු |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

| | | | | |
|---|---|---|---|---|
| | සැලසුම අධ්‍යයන ගැටලුවට අදාළ ව පැහැදිලි ව හා ක්‍රමානුකූල ව ඉදිරිපත් කර නැත. | සැලසුම අධ්‍යයන ගැටලුවට අදාළ ව පැහැදිලි ය./ ක්‍රමානුකූල ය. නමුත් දෙඅංශය ම පූර්ණ වී නැත. | සැලසුම අධ්‍යයන ගැටලුවට අදාළ ව පැහැදිලි ය. ක්‍රමානුකූල ය. | සැලසුම සුවිශේෂ පර්යේෂණ ප්‍රශ්න/අරමුණු ආමන්ත්‍රණය වන පරිදි පැහැදිලි ව, ක්‍රමානුකූල ව, පරිපූර්ණ ව, අනුකූලතාවෙන් යුතුව ඉදිරිපත් කර තිබේ. |
| | 4.1.3 අදාළ න්‍යාය හා පර්යේෂණ, මැදිහත්වීම් ක්‍රියාවලිය සහ තක්සේරු සැලසුම්ට මඟ පෙන්වීම්ක් නැත. | 4.2.3 අදාළ න්‍යාය හා පර්යේෂණ, ක්‍රියාවලිය හා තක්සේරු සැලසුමට ආසන්න වශයෙන් පමණක් මඟ පෙන්වයි. | 4.3.3 ප්‍රධාන න්‍යාය සහ පර්යේෂණ ඇසුරෙන් අදාළ ක්‍රියාකාරකම් සහ තක්සේරු සැලසුම් සකස් කර තිබේ. | 4.4.3 සූක්ෂම දෘෂ්ටියෙන් යුතුව නැවත සිතා බලා න්‍යාය හා පර්යේෂණ ගැටලුව සමග සම්බන්ධ කරමින් ක්‍රියාවලිය සහ තක්සේරු සැලසුම් සකස් කර තිබේ. |
| | 4.1.4 පර්යේෂණ ගැටලුවේ විචල්‍යවලට අදාළ ව මැදිහත්වීමේ සහ තක්සේරු සැලසුම් කර නැත. | 4.2.4 පර්යේෂණ ගැටලුවේ විචල්‍යවලට අදාළ ව මැදිහත්වීමේ සහ තක්සේරු සැලසුම් කර තිබේ. | 4.3.4 පර්යේෂණ ගැටලුවේ විචල්‍යවලට අදාළ ව පැහැදිලි හා ක්‍රමානුකූල ව මැදිහත්වීමේ සහ තක්සේරු සැලසුම් කර තිබේ. | 4.4.4 පර්යේෂණ ගැටලුවේ විචල්‍යවලට අදාළ ව ගැටලුව ගැඹුරින් අධ්‍යයනයට සුදුසු පරිදි විශිෂ්ට ලෙස මැදිහත්වීමේ සහ තක්සේරු සැලසුම් සකස් කර තිබේ. |
| **ලකුණු** | **0-2** | **3-5** | **6-8** | **9-10** |
| **සැලසුම ක්‍රියාත්මක කිරීම, ප්‍රතිසැලසුම් කිරීම සහ** | 5.1.1 සැලසුම් අදියර/ මැදිහත්වීම නිසි පරිදි ඉදිරිපත් වී නැත/ පැහැදිලි නැත. | 5.2.1 සැලසුම් අදියර/ මැදිහත්වීම විස්තර කිරීම පැහැදිලි ය. නමුත් ක්‍රමානුකූල | 5.3.1 සැලසුම් අදියර/ මැදිහත්වීම දත්ත සහිත ව, ක්‍රමානුකූල ව, පැහැදිලි ව, | 5.4.1 සැලසුම් අදියර/ මැදිහත්වීම දත්ත ඇසුරින් පරිපූර්ණව හා මනාව හේතු |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

| | | | | |
|---|---|---|---|---|
| **ප්‍රත්‍යවේක්ෂණ** | | බව අවම ය. | ඉදිරිපත් කර තිබේ. | දක්වමින් ක්‍රියාත්මක කර ඇති බව පැහැදිලි වන පරිදි ඉදිරිපත් කර තිබේ. |
| | 5.1.2 සැලසුම හා එහි පියවර අවශ්‍ය විට සංශෝධනය කරමින්, ප්‍රත්‍යවේක්ෂණය කරමින් ක්‍රියාත්මක කර නැත. | 5.2.2 සැලසුම හා එහි පියවර අවශ්‍ය විට සංශෝධනය කරමින්, ප්‍රත්‍යවේක්ෂණය කරමින් ක්‍රියාත්මක කර ඇත. | 5.3.2 සැලසුම හා එහි පියවර අවශ්‍ය විට සංශෝධනය කරමින්, ප්‍රත්‍යවේක්ෂණය කරමින්, විස්තරාත්මක ව ඉදිරිපත් කර ඇත | 5.4.2 සැලසුම හා එහි පියවර අවශ්‍ය විට සංශෝධනය කරමින්, ප්‍රත්‍යවේක්ෂණය කරමින්, ව්‍යවහාරය පිළිබඳ සජීවී චිත්‍රයක් මැවෙන පරිදි පරිපූර්ණ ව ඉදිරිපත් කර ඇත |
| | 5.1.3 ආරම්භක සැලසුමේන් ඉදිරි නව අදියරකට යාමට අවශ්‍ය සංස්කරණ /වෙනස්වීම්වලට අදාළ ව සාධාරණීකරණය කර නැත. | 5.2.3 මූලික අධ්‍යයන සැලසුමෙන් නව අදියරකට යාම ආශ්‍රිත ඕනෑ ම එක් හෝ විකරණයක් සඳහා සාධාරණීකරණයක් ඉදිරිපත් කර ඇත. | 5.3.3 මූලික සැලසුම නව අදියරකට විකරණය කිරීමේ දී සාධාරණීකරණය කර ඇත. | 5.4.3 සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී සාර්ථක අසාර්ථක බව පැහැදිලිව විග්‍රහ කර තිබේ |
| | 5.1.4 දෙවන අදියර සැලසුම, පර්යේෂණ ගැටලුවේ අදාළ ක්ෂේත්‍රය ආමන්ත්‍රණය කර නැත. | 5.2.4 දෙවන අදියර සැලසුම, පර්යේෂණ ගැටලුවේ අදාළ පර්යේෂණ ගැටලුවේ අදාළ ක්ෂේත්‍රය ආමන්ත්‍රණය කර ඇත්තේ අවම වශයෙනි. | 5.3.4 දෙවන අදියර, පර්යේෂණ ගැටලුවේ අදාළ ක්ෂේත්‍රය ආමන්ත්‍රණය කර ඇත. | 5.4.4 දෙවන අදියර, පර්යේෂණ ගැටලුවේ අදාළ ක්ෂේත්‍රය ප්‍රශස්ථ ලෙස ආමන්ත්‍රණය කර ඇත. |
| | 5.1.5 දෙවන අදියර සැලසුම, පළමු අදියර සැලසුම සමග | 5.2.5 දෙවන අදියර සැලසුම, පළමු අදියර සැලසුම සමඟ | 5.3.5 දෙවන අදියර සැලසුම, පළමු අදියර සැලසුම සමග | 5.4.5නව්‍ය ආකාරයට ගැටලුව විසඳීම කෙරෙහි |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

| | | | | |
|---|---|---|---|---|
| | සබඳතාවක් නැත.<br>5.1.6 ප්‍රතිවර්තන ක්‍රියාකාරකම් ආශ්‍රිත පුනර් සැලසුම්/ මැදිහත්වීම් දත්ත රැස් කිරීමේ දී ක්‍රියාත්මක කර නැත.<br>5.1.7 ප්‍රත්‍යවේක්ෂණ නැත/අවම ය.<br>5.1.8 ප්‍රත්‍යවේක්ෂණවල ඇත්තේ මතුපිට ගැඹුර/බාහිර අලංකාරය පමණි. ගැටලුව විසඳීම පිළිබිඹු නොවේ.<br>5.1.9 සීමා හඳුනාගෙන නැත. | සබඳතාවක් ඇත.<br>5.2.6 ප්‍රතිවර්තන ක්‍රියාකාරකම් ආශ්‍රිත පුනර් සැලසුමට/ මැදිහත්වීමට අදාළව දත්ත රැස්කර ඇත්තේ අවම වශයෙනි.<br>5.2.7 ප්‍රත්‍යවේක්ෂණ ඇත. යම් තරමකට ගැඹුරින් ඉදිරිපත් කර තිබේ<br>5.2.8 ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලිය පර්යේෂණ ක්‍රියාවලියේ/ වෘත්තීය සංවර්ධනයේ/ ප්‍රජාවේ වැඩි දියුණුව පෙන්වයි.<br>5.2.8 සීමා හඳුනාගෙන ඇත, නමුත් පැහැදිලිව දක්වා නැත. | මනා සබඳතාවක් ඇත.<br>5.3.6 ප්‍රතිවර්තන ක්‍රියාකාරකම් ආශ්‍රිත පුනර් සැලසුම්වලට අදාළ මැදිහත්වීම්, සැලසුම් ක්‍රියාත්මක කර තිබේ. (අවම වශයෙන් අදියර දෙකක් වත්)<br>5.3.7 ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලියෙන් ගැටලුව, ප්‍රවනතාව, විසඳීම පිළිබිඹු වේ.<br>5.3.8 ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලිය පර්යේෂණ ක්‍රියාවලියේ, වෘත්තීය සංවර්ධනයේ හා ප්‍රජාවේ වැඩි දියුණුව පෙන්වයි.<br>5.3.9 සීමා පැහැදිලි ව දක්වයි. | යොමුව ඇත.<br>5.4.6 ප්‍රතිවර්තන ක්‍රියාකාරකම් ආශ්‍රිත පුනර් සැලසුම්වලට අදාළ මැදිහත්වීම්, සැලසුම් පූර්ණ ලෙස ක්‍රියාත්මක කර තිබේ.<br>5.4.7 ප්‍රත්‍යවේක්ෂණය පදනම් කරගනිමින් සැලසුම ක්‍රියාත්මක කිරීම ගැන සිතුවිල්ල යොමු කර ඇත.<br>5.4.8 ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලිය පර්යේෂණ ක්‍රියාවලියේ, වෘත්තීය සංවර්ධනයේ හා ප්‍රජාවේ යන තෙ අංශයේ ම ගැඹුරු වැඩි දියුණුව පැහැදිලි ව පෙන්වයි.<br>5.4.8 සීමා ඉතා පැහැදිලි ව හා ක්‍රමවත් ව දක්වයි. |
| ලකුණු | 0-8 | 9-15 | 16-24 | 25-30 |
| **දත්ත විශ්ලේෂණය, අනාවරණ සහ ප්‍රත්‍යවේක්ෂණ ඉදිරිපත් කිරීම** | 6.1.1 දත්ත විශ්ලේෂණ ක්‍රමශිල්ප දත්තවලට අනුකූලව යොදාගෙන නැත. | 6.2.1 අධ්‍යයනයේ අරමුණු සහ විෂයට අනුකූලව දත්ත විශ්ලේෂණ ක්‍රම ශිල්ප යොදාගෙන ඇත්තේ අවම | 6.3.1 අරමුණු සහ පවතින ඉඩකඩට අනුකූලව යෝග්‍ය දත්ත විශ්ලේෂණ ක්‍රම ශිල්ප භාවිත කර තිබේ. | 6.4.1 පවතින ගැටලුවට ආමන්ත්‍රණය කළ හැකි පරිදි අරමුණුවලට අනුකූලව, සුවිශේෂව, පවතින |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

| | | | | |
|---|---|---|---|---|
| | | වශයෙනි. | | අවස්ථාවන්ට ඔබ්බට වූ යෝග්‍ය දත්ත විශ්ලේෂණ ක්‍රම ශිල්ප ද අන්තර්ගත ය. |
| | 6.1.2 අනාවරණ පැහැදිලිව ගොනු කර නැත. | 6.2.2 අනාවරණ පැහැදිලිව ගොනු කර ඇත.<br>6.2.3 අනාවරණ ඉදිරිපත් කිරීමේ දී පුනරුක්ති සහිත ය. අපැහැදිලි ය. | 6.3.2 අනාවරණ පැහැදිලිව ගොනු කර, ඵලදායක ලෙස ඉදිරිපත් කර තිබේ. | 6.4.2 අනාවරණ පැහැදිලිව ගොනු කර, මනා අර්ථකතන සහිතව, ඵලදායක ලෙස ඉදිරිපත් කර තිබේ. |
| | 6.1.3 අනාවරණ අධ්‍යයනයට අදාළ නැත, | 6.2.4 අනාවරණ අධ්‍යයන සමඟ හොඳින් සම්බන්ධ නොවේ. | 6.3.3 අනාවරණ අධ්‍යයන සමඟ හොඳින් සම්බන්ධ වේ. පූර්ව පර්යේෂණ අනාවරණ ඇසුරෙන් නව අනාවරණ තහවුරු කර ඇත. | 6.4.3 පූර්ව සහ සමකාලීන අධ්‍යයන අන්තර්ගතය සමඟ සංස්ලේෂණය කර දත්ත අර්ථකතන, අනාවරණ, ඉදිරිපත් කර තිබේ. නව අනාවරණ තහවුරු කර ඇත. |
| | 6.1.4 වලංගු නැති හෝ අසම්පූර්ණ අර්ථකථන පැව<br>6.1.5 අනාගත පර්යේෂණ සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට යොමු වී නැත. | 6.2.5 අසම්පූර්ණ දත්ත, අර්ථකථන සහිත ය.<br>6.2.6 අනාගත පර්යේෂණ සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත (අවම වශයෙන් එකක්වත්) | 6.3.4 දත්ත වලංගුතාවයෙන් යුතුව අර්ථකතනය කර තිබේ.<br>6.3.5 අනාගත පර්යේෂණ සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත. | |
| | 6.1.6 පර්යේෂණ සන්ධර්භය සහ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබිඹු වන පරිදි | 6.2.7 පර්යේෂණ සන්ධර්භය සහ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අවම වශයේ පිළිබිඹු වන පරිදි දත්ත විශ්ලේෂණය කර ඇත. | 6.3.6 පර්යේෂණ සන්ධර්භය සහ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වශයේ පිළිබිඹු වන පරිදි දත්ත විශ්ලේෂණය කර ඇත. | 6.4.4 සන්දර්භය, වෘත්තියට අදාළත්වය, පෞද්ගලික සංවර්ධනය සහ ක්ෂේත්‍රයේ අනෙකුත් වෘත්තීය ආශ්‍රිත ගැඹුරු සංවර්ධනයක් |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

| | | | | |
|---|---|---|---|---|
| | දත්ත විශ්ලේෂණය කර නැත.<br>6.1.6 වෘත්තීය සංවර්ධනය හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය පිළිබිඹු නොවේ.<br>6.1.7 අනාවරණ ඉදිරිපත් කිරීමේ දී APA ක්‍රමයට වගු, ප්‍රස්තාර, ආශ්‍රිත ග්‍රන්ථ ඇතුළත් කර නැත. | 6.2.8 වෘත්තීය සංවර්ධනය හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය අවම මට්ටමින් පිළිබිඹු වේ.<br>6.2.9 අනාවරණ ඉදිරිපත් කිරීමේ දී APA ක්‍රමයට වගු, ප්‍රස්තාර, ආශ්‍රිත ග්‍රන්ථ ඇතුළත් කර ඇත. නමුත් දෝෂ සහිත ය. | 6.3.7 වෘත්තීය සංවර්ධනය හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය පිළිබිඹු වේ.<br>6.3.8 අනාවරණ ඉදිරිපත් කිරීමේ දී APA ක්‍රමයට වගු, ප්‍රස්තාර, ආශ්‍රිත ග්‍රන්ථ ඉදිරිපත් කර තිබේ. | පිළිබිඹු වන සේ දත්ත විශ්ලේෂණය කර තිබේ.<br>6.4.5 වෘත්තීය සංවර්ධනය හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය පරිපූර්ණ ව පිළිබිඹු වේ.<br>6.4.6 අවසන් සාකච්ඡාව ගැඹුරු විස්තරාත්මක අන්තර් සබඳතා සහිතව අර්ථාන්විත ව ඉදිරිපත් කර ඇත. |
| **ලකුණු** | **0-2** | **3-5** | **6-8** | **9-10** |
| **වෘත්තීය සංවර්ධනයට දායකත්වය සහ ගොඩනඟා ගත් ව්‍යවහාරික දැනුම** | 7.1.1 නව ආකාරයකින් ගැටලුව විසඳීමට යොමු වී නැත.<br>7.1.2 නව දැනුමක් ගොඩ නගා නැත.<br>7.1.3 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනයට දායකත්වයක් නැත.<br>7.1.4 පර්යේෂකයාගේ | 7.2.1 නව ආකාරයකින් ගැටලුව විසඳීමට තරමක යොමුවක් ඇත.<br>7.2.2 නව දැනුමක් තරමක් දුරට ගොඩ නගා ඇත.<br>7.2.3 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනයට දායකත්වයක් ඇත.<br>7.2.4 පර්යේෂකයාගේ අංශයේ | 7.3.1 නව ආකාරයෙන් ගැටලුව විසඳීමට යොමුව ඇත.<br>7.3.2 නව දැනුමක් ගොඩ නගා ඇත.<br>7.3.3 පර්යේෂකයාගේ අංශයේ සංවර්ධනය සහ පර්යේෂණ පරිශ්‍රයේ සංවර්ධනය පැහැදිලිව පෙන්නුම් කරයි. | 7.4.1 නව්‍ය ආකාරයට අර්ථාන්විතව ගැටලුව විසඳීමට යොමුව තිබේ.<br>7.4.2 නව දැනුමක් උත්පාදනය වී තිබේ.<br>7.4.3 පර්යේෂණ පරිශ්‍රය, පර්යේෂකයා සහභාගිවන්නෝ යන සෑම අංශයක ම සංවර්ධනය |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

| | | | | |
|---|---|---|---|---|
| | අංශයෙන් පමණක් සුලු සංවර්ධනයක් පිළිබිඹු වේ. | සහ පර්යේෂණ පරිශ්‍රයේ අවම සංවර්ධනයක් පෙන්නුම් කරයි. | | පිළිබිඹු වේ. |
| **ලකුණු** | **0** | **1-2** | **3-4** | **5** |
| **ලේඛන ශෛලිය හා සමස්ථ නිමාව** | 8.1.1 උපුටා ගැනීම් නිවැරදි නොවේ.<br>8.1.2 ශාස්ත්‍රීය භාෂාව නැත.<br>8.1.3 දුර්වල සංවිධානය<br>8.1.4 සංකල්ප අපැහැදිලි ය.<br>8.1.5 අක්ෂර දෝෂ, පද බෙදීමේ දෝෂ බහුල ය.<br>8.1.6 මූලික තාක්ෂණික උපදෙස් පිළිපැද නොමැත.<br>8.1.7 උප ග්‍රන්ථ, ඇමුණුම් ඉදිරිපත් කර නැත. | 8.2. පූර්ණ ලෙස නොව සාමාන්‍ය ලෙස<br>- උපුටා ගැනීම් දක්වා ඇත<br>- ශාස්ත්‍රීය භාෂා හැකියාව පිළිබිඹු වේ.<br>- මනා සංවිධානය සහ පැහැදිලි යොමුව ඇත.<br>- සංකල්ප පැහැදිලිව ඉදිරිපත් කර ඇත.<br>8.2.5 අක්ෂර දෝෂ, පද බෙදීමේ දෝෂ අවම ය.<br>8.2.6 මූලික තාක්ෂණික උපදෙස් මද වශයෙන් පිළිපැද ඇත.<br>8.2.7 උප ග්‍රන්ථ, ඇමුණුම් ඉදිරිපත් කර ඇති නමුත් ක්‍රමානුකුල නැත. | 8.3.1 උපුටා ගැනීම් හොඳින් දක්වා ඇත.<br>8.3.2 ශාස්ත්‍රීය භාෂා හැකියාව පිළිබිඹු වේ.<br>8.3.3 මනා සංවිධානය සහ පැහැදිලි යොමුව ඇත.<br>8.3.4 සංකල්ප පැහැදිලිව ඉදිරිපත් කර ඇත.<br>8.3.5 අක්ෂර දෝෂ, පද බෙදීමේ දෝෂ ඉතා අවම ය.<br>8.3.6 මූලික තාක්ෂණික උපදෙස් පිළිපැද ඇත.<br>8.3.7 උප ග්‍රන්ථ, ඇමුණුම් සුදුසු පරිදි ක්‍රමවත්ව ඉදිරිපත් කර ඇත. | 8.4.1 පැහැදිලි විශ්ලේෂණය සහ අධ්‍යයනයේ සියලු අංශ අතර මනා තර්කානුකූල සබඳතාවක් පෙන්වා දෙමින් ඉදිරිපත් කර තිබේ.<br>8.4.2 අක්ෂර දෝෂ, පද බෙදීමේ දෝෂ රහිත ය.<br>8.4.3 මූලික තාක්ෂණික උපදෙස් ඉතාමත් නිවැරදි ලෙස පිළිපැද ඇත.<br>8.4.4 උප ග්‍රන්ථ, ඇමුණුම් සුදුසු පරිදි ඉතා ක්‍රමවත්ව හා අනුපිළිවෙළට ඉදිරිපත් කර ඇත. |
| **ලකුණු** | 0-4 | 5-10 | 11-15 | 16-20 |
| **මුළු ලකුණු** | **0-22** | **28-49** | **56-78** | **84-100** |


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


කොඩිතුවක්කු, ජී., රඹුක්වැල්ල, එම්. එල්. කේ., සහ දිසානායක, එන්. ඩී. (2006). *ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාමූලික පර්යේෂණ පරිසරය.* මහරගම: පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය. (2003). *ක්‍රියාමූලික පර්යේෂණ වැඩ සටහන.* මහරගම: ප්‍රාථමික ගණිත ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය. (2006). *අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේදය: තේමා පාඨමාලාව - ක්‍රියාමූලික පර්යේෂණ, ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාවක් සකස් කිරීම.* මහරගම: පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය. (2011). *ක්‍රියාමූලික පර්යේෂණ අත්පොත - අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව.* මහරගම: ගුරු බලවත්තකරණ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය. (2011). *ක්‍රියාමූලික පර්යේෂණ අත්පොත - පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව.* මහරගම: ගුරු බලවත්තකරණ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය. (2012). *ක්‍රියාමූලික පර්යේෂණ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මාර්ගෝපදේශ සංග්‍රහය.* මහරගම: ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

රඹුක්වැල්ල, එල්. කේ. සහ ගුණතිලක ඒ. එම්. ඩී. ඩබ්. (2011). *ක්‍රියාමූලික පර්යේෂණ න්‍යාය හා ව්‍යවහාර.* මහනුවර: කර්තෘ ප්‍රකාශන.

Burns, R. B. (1996). *Introduction to Research Methods.* 3rd ed. South Melbourne: Longman.

Elliott, J. (1991). *Action Research for Educational Change.* Milton Keynes: Open University.

Hampe, N. (2013). *Reflective Practice and Writing: a Guide to Getting Started.* Retrieved April 9, 2015, from http://www.alia.org.au/sites/default/files/documents/ Reflective. Practice.Writing.Guide20130409JB.pdf.

Hopkins, D. (1985). *A Teacher's Guide to Class Room Research.* Milton Keynes: Open University.

Kemmis, S. & Mctaggart, R. (1998). *Action Research Planner.* Victoria: Denkin University

Levin, K. (1947). *Reading in Social Psychology.* New York: Henry Holt and Company.




Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

Levin, K. (1948). *Resolving Social Conflicts.* Washington: American Psychological Association.

McKernan, J. (1998). *Curriculum Action Research.* 2nd ed.London: Kongan Page Limited.

Schon, D.(1991). *The Reflective Practitioner: How professionals think in action*. San Francisco: Jossey Barr.

University of San Diego. (2013). *2013 Research handbook. School of leadership and education sciences.* California: Department of Learning and Teaching.



Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

1 වන ඇමුණුම : වසුන (පිටකවරය) සඳහා ආදර්ශය

# මාතෘකාව

Font : FMAbabld
Font Size : 28

පර්යේෂකගේ නම

Font : FMAbabld
Font Size : 18

ලියාපදිංචි අංකය

Font : FMAbabld
Font Size : 16

පාඨමාලාවේ නම

අධ්‍යයන වර්ෂය/වර්ෂ

Font : FMAbabld
Font Size : 16

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම



Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

Font : FMAbabld
Font Size : 16

2015

**2 වන ඇමුණුම : ප්‍රකාශය ඇතුළත් පිටුව සඳහා ආදර්ශය**

## ප්‍රකාශය

ජාතික අධ්‍යාපන ආයතනයේ ............................................... පාඨමාලාවේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන මෙම ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාව මගේ වෘත්තීය භූමිකාව ඉටු කිරීමේ දී මතු වූ ගැටලුවක් විසඳීමට කරනු ලැබූ උත්සාහයක ප්‍රතිඵලයකි.

වාර්තාවේ අන්තර්ගත කිසිවක්, පූර්වයෙන් ජාතික අධ්‍යාපන ආයතනය හෝ වෙනත් ආයතනයක් සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධයක අන්තර්ගත කරුණු යොමුවකින් තොර ව, උපුටා ගෙන නොමැති බවත්, මූලාශ්‍රයේ නම් සඳහන් නොකොට මිස වෙනත් මූලාශ්‍රවල හෝ පොත්පත්වල කිසිවක් උපුටා නොගන්නා ලද බවත්, මෙය මා විසින් කරන ලද ස්වාධීන නිබන්ධනයක් බවත්, සහතික කරමි.

අත්සන :- දිනය:

නම :-

ලියාපදිංචි අංකය :-

රාජකාරි ලිපිනය :-

පෞද්ගලික ලිපිනය :-

දුරකථන අංකය :-


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

3 වන ඇමුණුම : වාර්තාවේ ඇතුළත පිටු සැකසුම සඳහා නිදසුන

Font : FMAbabld
F.Size : 16

## පෙළපොත ළමයාගේ ඉගෙනුමට බලපාන ආකාරය

...මෙසේ ළමයින් අභ්‍යාසවලට පිළිතුරු සැපයීමේ දී කළ වැරදි හා ඔවුන්ගේ හා ඔවුන්ගේ පරිසරයේ සුවිශේෂතා ගැන ද මගේ ඉගැන්වීමේ දී ළමයින්ගේ අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීම ගැන ද අවලෝකනය කරමින් සිටින විට ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ උපදේශකගේ පෙළඹවීම මත පෙළපොතේ පාඩම ඉදිරිපත් කර ඇති ආකාරය, පාඩමට යොදා ඇති මාතෘකාව, පාඩමේ පරස්පර යෙදුම් ආදී කරුණු පිළිබඳ ව ද නැවත සියුම් ව කල්පනා කරන්නට පෙළඹුණෙමි. පෙළපොතට සම්බන්ධ කරුණු සහ එම කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය ළමයාගේ ඉගෙනුමට බලපා ඇති ද යන අනුමානය මේ අනුව මගේ සිතේ ඇතිවන්නට විය. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ ක්‍රමය අනුව මා පැවරූ අභ්‍යාසය අසාර්ථක වීමට පෙළපොතේ වායු පීඩනය හා සුළං යන පාඩමේ අපැහැදිලි බව ද හේතු වන්නට ඇතැයි මට සැක සිතේ (පාඩමේ ඡායා පිටපතක් 1 වන ඇමුණුමේ දැක්වේ).

පෙළපොතේ වායු පීඩනය හා සුළං යන මාතෘකාව ද පෘථිවිය මත සුළං හා පීඩන තීර පැතිර ඇති ආකාරය යන අනු මාතෘකාව ද මගේ අවධානයට යොමු කරමින් පර්යේෂණ උපදේශක මෙසේ විමසී ය. ...

Font : FMAbaya
F.Size : 12
Space : 1.5
No Enter between pharagraphs

Font : FMAbabld
F.Size : 12

### මූලික කරුණු සොයා බැලීම

Font : FMAbabld
F.Size : 14

**වෘත්තීය සගයකුගේ සහාය ලබා ගැනීම**

පෙළපොතේ පාඩම් පිළිබඳ ව මතු වූ ගැටලුව විසදා ගැනීමට අප පාසලේ ම සමාජ අධ්‍යයනය විෂයය උගන්වන තවත් ගුරු මහත්මියකගේ සහාය පැතීමි. සාකච්ඡා කොට පහත දැක්වෙන අයුරු නිගමනවලට එළඹුණෙමි. ...

Font : FMAbaya
F.Size : 12
Space : 1.5


Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

4 වන ඇමුණුම : ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාව ඇගැයීම් පත්‍රිකාව සඳහා ආදර්ශය

## ක්‍රියාමූලික පර්යේෂණ වාර්තාව ඇගැයීම් පත්‍රිකාව

පාඨමාලාව :-

නිබන්ධ මාතෘකාව :-

ගුරු ශිෂ්‍යයාගේ නම :-

ලියාපදිංචි අංකය :- **මුළු ලකුණු** [ ]

| ඇගැයීම් නිර්ණායක | ලකුණු | පළමු මට්ටම | දෙවන මට්ටම | තුන්වන මට්ටම | හතරවන මට්ටම |
|---|---|---|---|---|---|
| **මුළු ලකුණු** (100) | | **0-20** | **28-49** | **57-79** | **85-100** |
| 1. හැඳින්වීම (පර්යේෂණ ගැටලුව) | පිරිනැමූ ලකුණ | | | | |
| | වෙන් කළ ලකුණු | 1-2 | 3-5 | 6-8 | 9-10 |
| 2. ගැටලුව පිළිබඳ කරුණු සොයා බැලීම | පිරිනැමූ ලකුණ | | | | |
| | වෙන් කළ ලකුණු | 0-2 | 3-5 | 6-8 | 9-10 |
| 3. සුවිශේෂ ප්‍රශ්න/ සුවිශේෂ අරමුණු | පිරිනැමූ ලකුණ | | | | |
| | වෙන් කළ ලකුණු | 0 | 1-2 | 3-4 | 5 |
| 4. සැලසුම සහ එහි පියවර | පිරිනැමූ ලකුණ | | | | |
| | වෙන් කළ ලකුණු | 1-2 | 3-5 | 6-8 | 9-10 |
| 5. සැලසුම ක්‍රියාත්මක කිරීම, ප්‍රතිසැලසුම් කිරීම සහ ප්‍රත්‍යවේක්ෂණ | පිරිනැමූ ලකුණ | | | | |
| | වෙන් කළ ලකුණු | 0-8 | 9-15 | 16-24 | 25-30 |
| 6. දත්ත විශ්ලේෂණය, අනාවරණ සහ ප්‍රත්‍යවේක්ෂණ ඉදිරිපත් කිරීම | පිරිනැමූ ලකුණ | | | | |
| | වෙන් කළ ලකුණු | 0-2 | 3-5 | 6-8 | 9-10 |
| 7. වෘත්තීය සංවර්ධනයට දායකත්වය සහ ගොඩනගා ගත් ව්‍යවහාරික දැනුම | පිරිනැමූ ලකුණ | | | | |
| | වෙන් කළ ලකුණු | 0 | 1-2 | 3-4 | 5 |
| 8. ලේඛන ශෛලිය හා සමස්ථ නිමාව | පිරිනැමූ ලකුණ | | | | |
| | වෙන් කළ ලකුණු | 0-4 | 5-10 | 11-15 | 16-20 |
| **පිරිනැමූ ලකුණු** | | | | | |

Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1

**විමර්ෂණ සටහන් සහ නිර්දේශ**

……………………………………………………………………………………………………

……………………………………………..……………………………………………

……………………………………………..……………………………………………

……………………………………………………………………………………………………

……………………………………………..……………………………………………

……………………………………………..……………………………………………

**නිබන්ධය පිළිබඳ අවසන් නිර්දේශය** (✓ ලකුණ යොදන්න)

| | |
|---|---|
| - සමස්ථ නිබන්ධය ම සංශෝධනය කළ යුතු ය | |
| - සංශෝධන කළ යුතු ය | |
| - අපේක්ෂිත මට්ටමට පවතී | |
| - විශිෂ්ට මට්ටමේ පවතී | |

පරීක්ෂකවරයාගේ නමඃ-

අත්සන ඃ-

දිනය ඃ-



Copy write: Department of Research & Development, National Institute of Education, Maharagama. Version: 1